අධ්‍යාපන අමාත්‍යාංශය Final
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref.: ED/09/02/13/04/34 ඔබේ යොමුව / உமது இல. / Your Ref.: දිනය / திகதி / Date: 2019/ 12/

**චක්‍රලේඛ අංක 03 /2019**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විදුහල්පතිවරුන් වෙත.

## <u>ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන</u>

ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන පිළිබඳ ව 2008 අප්‍රේල් මස පාසල් වෙත නිකුත් කරන ලද 15/2008 දරන චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය හා 2016 ජනවාරි මස 22 දින නිකුත් කරන ලද 04/2016 චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛය සහිත උපදෙස් සංග්‍රහය මෙතැන් සිට ක්‍රියාත්මක වේ.

මේ වන විට පාසල් මට්ටමෙන්, කලාප මට්ටමෙන් හා පළාත් මට්ටමෙන් පිහිටුවා ඇති ශිෂ්‍ය පාර්ලිමේන්තු, නව චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය අනුව ප්‍රතිසංවිධානය කර ගත යුතු ය.

පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ප්‍රජාතන්ත්‍රවාදය, එහි වගකීම හා වගවීම පිළිබඳ ව, නීතියේ ආධිපත්‍යය, ඡන්දය හා ඡන්දය ප්‍රකාශ කිරීමේ වැදගත්කම සම්බන්ධ ප්‍රායෝගික අත්දැකීම් ළඟා කර දීමේ අවස්ථා විවර කර දීමත් එමගින් සංවාදය, සම්මුතිය, අන්‍ය මතයන්ට සවන් දීම, ගරු කිරීම හා බහුතර එකඟතාවන් පිළිගැනීම වැනි ආකල්ප, කුසලතා ළඟා කර ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදී අගයන් හා වටිනාකම් පිළිබඳ අත්දැකීම් අත්පත් කරගෙන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් මෙන් ම ජීවන ක්‍රමයක් බව ද අත්දැකීමෙන් අවබෝධ කර ගැනීමට අවස්ථා උදා කර දීම පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමින් පිහිටුවනු ලබන ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහනේ මූලික අරමුණයි.

ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහනින් පාසල් සිසුන් විවිධ අත්දැකීම් ලබා ගන්නා අතර ප්‍රාදේශික ව හා ජාතික ව ඔවුන් දකින සමාජයීය හා ආර්ථික ගැටලු පිළිබඳ සංවාද කරමින් ඒවාට විවිධ විසඳුම් යෝජනා කරමින් එකඟතාවලට යොමු වීමේ අවස්ථා හිමි වනු ඇත. හැඳින ගත් ගැටලු සඳහා විසඳුම් සෙවීමට පාසල් සිසුන් වශයෙන් සාමූහික ව විවිධ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාවට නැංවීමටත්, ඔවුන්ට විසඳිය නොහැකි ගැටලු පිළිබඳ අදාළ බලධාරීන්ගේ අවධානය යොමු කිරීමටත් මෙම ශිෂ්‍ය පාර්ලිමේන්තුවෙන් අවස්ථා නිර්මාණය කෙරෙනු ඇත.

තරුණ ශිෂ්‍ය ප්‍රජාවට සිය අභිමානය හා ගෞරවය පිළිබඳ වටිනාකමක් ලැබෙන අතර ම, ජාතිය ගොඩ නැඟීම සඳහා අවශ්‍ය ධනාත්මක ආකල්ප සංවර්ධනය කර ගනිමින්, ජාතික මෙහෙවරට දායක වීමට මහඟු අවස්ථා උදා වනු ඇත.

ප්‍රාදේශික ව හා ජාතික මට්ටමෙන් සිසුන් අත්දකින ගැටලු සම්බන්ධයෙන් විද්වතුන් හා විවෘත ව සාකච්ඡා කිරීමටත් ප්‍රාදේශීය, පළාත් හා ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන්, සැලසුම් හා ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයක් ලබා දීමටත් ප්‍රතිපත්ති තීරකයන් හා සැලසුම්කරුවන් සමග විවෘත සංවාද ගොඩනඟා ගැනීමටත් ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහනෙන් අවස්ථා සැලසෙනු ඇත.ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන පුරවැසි අධ්‍යාපන විෂයය හා සමගාමී ව ක්‍රියාත්මක වෙයි. මැතිවරණ කොමිෂන් සභාව සිය පස් අවුරුදු උපාය මාර්ගික සැලසුම මගින් ප්‍රජාතන්ත්‍රවාදය, සර්වජන ඡන්ද බලය හා එහි වැදගත්කම පිළිබඳ ව

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் +94112784832 +94112784825
ලේකම් / செயலாளர் +94112784811 +94112785162

විදුහල්පතිවරුන්, ගුරුවරුන්, පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සිදු කෙරෙන දැනුවත් කිරීම් ද ශිෂ්‍ය පාර්ලිමේන්තුවෙන් ක්‍රියාවට නැංවෙයි. ඒ සඳහා අවශ්‍ය සහය මැතිවරණ කොමිෂන් සභාවේ හා මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ලැබෙනු ඇත.

පාසල් මට්ටමින් ශිෂ්‍ය පාර්ලිමේන්තු පිහිටුවීම, ක්‍රියාවට නැංවීම හා කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුව සඳහා ශිෂ්‍ය නියෝජිතයන් තෝරා ගැනීමේ වගකීම කලාප හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ ඍජු මඟ පෙන්වීම යටතේ විදුහල්පතිවරුන්ට පැවරේ. කලාප/පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තු පිහිටුවීම හා ක්‍රියාවට නැංවීමත් ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව සඳහා ශිෂ්‍ය නියෝජිතයන් තෝරා ගැනීමත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සතු වගකීමකි. මේ සියලු කාර්යයන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නියාමනයට හා අධීක්ෂණයට යටත් වෙයි.

පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහ ගුරුවරුන්ගේ සක්‍රිය දායකත්වයෙන් ක්‍රියාත්මක විය යුතු ය. පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ශිෂ්‍ය අමාත්‍යාංශ හා ඊට සමගාමී ව ක්‍රියාවට නැංවෙන වැඩසටහන් භාර ව පාසලේ සියලු ම ගුරු මණ්ඩලය ඔවුන් උගන්වන විෂයය ක්ෂේත්‍රය හා හැකියා අනුව නම් කිරීම විදුහල්පතිවරුන්ගේ වගකීමකි. කලාප හා පළාත් මට්ටමේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවල අමාත්‍යාංශ හා වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ දී සියලු ම විෂය අධ්‍යක්ෂවරුන්ට හා ගුරු උපදේශකවරුන්ට වගකීම් පැවරීමට කලාප /පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කටයුතු කළ යුතු ය.

කලාප හා පළාත් මට්ටමින් ශිෂ්‍ය පාර්ලිමේන්තු අඛණ්ඩ ව හා සක්‍රීය ව පවත්වාගෙන යාමේ වගකීම කලාප/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණය යටතේ කලාප/පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන භාර විෂය අධ්‍යක්ෂවරුන්ට පැවරෙනු ඇත.

පාසල් පද්ධතියේ දී ක්‍රියාවට නැංවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ, වෙනත් රාජ්‍ය ආයතන හා විවිධ සංවිධාන මඟින් යොමු කරන වැඩසටහන්, වැඩසටහනේ ස්වභාවය අනුව අදාළ ශිෂ්‍ය අමාත්‍යාංශය හා එම ශිෂ්‍ය අමාත්‍යාංශයට සමගාමී ව ක්‍රියාත්මක වැඩසටහන් මඟින් ක්‍රියාවට නැංවිය යුතු ය.

රාජ්‍ය හා පෞද්ගලික ආයතන මඟින් ක්‍රියාවට නංවන විවිධ ව්‍යාපෘති /වැඩසටහන්/සේවා සම්බන්ධයෙන් පාසලේ ගුරුභවතුන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීමත් සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශ සතු වගකීමකි.

ශිෂ්‍ය පාර්ලිමේන්තු පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමින් පිහිටුවීම පිළිබඳ තොරතුරු මෙහි අන්තර්ගත උපදෙස් සංග්‍රහයෙහි සවිස්තරාත්මක ව දක්වා ඇත. එය හොඳින් අධ්‍යයනය කර විධිමත් පරිදි ශිෂ්‍ය පාර්ලිමේන්තු පිහිටුවීමට කටයුතු කරන මෙන් දන්වමි.

විෂය සමගාමී ක්‍රියාකාරකමක් ලෙස මෙම ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය බවත් ඒ සඳහා ප්‍රමුඛතාව දී කටයුතු කරන ලෙසත් අවධාරණය කරමි.

එන්. එච්. එම්. චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
3. සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
4. අධ්‍යක්ෂ ජනරාල් , ජාතික අධ්‍යාපන ආයතනය
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
6. පාර්ලිමේන්තු මහ කොමසාරිස්, පාර්ලිමේන්තු මහ කොමසාරිස් කාර්යාලය

## ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන හැඳින්වීම

අනාගත පුරවැසියකු ලෙස මිනිස් සමාජයේ විවිධ ක්‍රියාකාරකම්වලට අනුගත වීමේ නිපුණතාව දරුවාට ලබා දිය යුතු වන්නේ අධ්‍යාපනයෙනි. සමාජානුයෝජනය සමග තමා ජීවත් වන සංස්කෘතිය පවරා ගැනීමට අවශ්‍ය නිපුණතාව ඔවුන් වෙත ලබා ගැනීමේ අවස්ථා සම්පාදනය කළ යුතු ය. පුද්ගලයා හුදෙකලා සත්ත්වයකු නොවන අතර, කණ්ඩායමක්, සමූහයක් සමග සහජීවනයෙන් ජීවත් වන අතර ම, අත්‍යවශ්‍යයෙන් ම තමා ජීවත් වන සමාජයේ සමාජයීය පැතිකඩවල සංස්කෘතික හර පද්ධති පිළිබඳ ව අත්දැකීම් ග්‍රහණය කර ගත යුතු වේ.

පාලන සංවිධානවල පවතින විවිධ වෙනස්කම් පිළිබඳ අවබෝධය හා අත්දැකීම් ලබා ගැනීමට අධ්‍යාපනය මගින් ද අවස්ථාව සලසා දී ඇත්තේ එබැවිනි. එමගින් ඔවුන්ට අනාගත පුරවැසියන් වශයෙන් තමා ජීවත් වන පරිසරය පිළිබඳ ව හා සමාජයේ ක්‍රියාත්මක වන විවිධ පාලන හා සමාජ ක්‍රම පිළිබඳ ව පුළුල් අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය යනු සමාජ හා ජීවන ක්‍රමයක් මෙන් ම පාලන ක්‍රමයකි. එම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයට අනුගත ව කටයුතු කරන අනාගත පරපුරට ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමය, එහි ව්‍යවහාර හා වටිනාකම පිළිබඳ ව අත්දැකීම් ලබා දිය යුතු වේ. ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ අගයන්, නියෝජිත ප්‍රජාත්‍රන්තවාදය, එහි වගකීම් හා වගවීම්, ඡන්ද ප්‍රකාශ කිරිම හා ඡන්ද ප්‍රකාශ කිරීමේ වැදගත්කම, නීතිය හා නීතියේ ආධිපත්‍යය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් පාසල් සිසුන්ට ලබා දීම සඳහා ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන පාසල් පද්ධතියට හඳුන්වා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර තිබේ.

මෙම ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහනින් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන පිළිබඳ ව ද ප්‍රජාතන්ත්‍රවාදි සමාජයක ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු ක්‍රමය හා සම්ප්‍රදාය පිළිබඳ ව ද අවබෝධය ලබා දිමට කටයුතු කරනු ඇත.

**ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහනේ අරමුණු**

01. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික සංකල්ප හා ඒවායේ භාවිතය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීම.

02. ජාතික අධ්‍යාපන පොදු අරමුණු හා පොදු නිපුණතා සමූහ ළඟා කර ගැනීම සඳහා ක්‍රියාකාරි අවස්ථා සම්පාදනය කිරීම.

03. උගත් පාඩම් හා අභියාචනා කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශවලට අනුව 'සාමය සහ සංහිඳියාවZ ඇති කිරීම සඳහා ජාතික වැඩසටහනක් පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම.

04. විවිධ ජනවර්ග හා ආගමික කණ්ඩායම් අතර සාමූහිකත්වය, සහජීවනය, සහෝදරත්වය හා අන්‍යෝන්‍ය අවබෝධය පුළුල් කිරීමෙන්; සමාජ ඒකාබද්ධතාව වර්ධනය කිරිමට හා ගැටුම් නිරාකරණයට මංපෙත් විවර කිරීම.

05. ප්‍රාදේශීය හා ජාතික සංවර්ධනය අරමුණු කර ගනිමින් ජාතිය ගොඩනැඟීමේ (Nation Building) කාර්යය සඳහා පාසල් දරුවන් සෘජු ව මැදිහත් කර ගැනීම.

06. පාසල් දරුවන්ගේ නායකත්ව කුසලතා සංවර්ධනය කිරීම.

07. පුරවැසි අධ්‍යාපනය විෂයය මගින් න්‍යායාත්මක ව හා ප්‍රායෝගික ව පාසල් ප්‍රජාව තුළ සංවර්ධනය කිරීමට අපේක්ෂිත නිපුණතා වඩාත් ඵලදායි ව හා ක්‍රියාකාරී ව ඉටුකර ගැනීම.

ශිෂ්‍ය පාර්ලිමේන්තුව දැනට පවතින විධිමත් පාර්ලිමේන්තුවෙහි ආකෘතියක් නොවේ. ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහනේ අරමුණු පුළුල් ව සාක්ෂාත් කර ගැනීමටත්, ප්‍රායෝගික අත්දැකීම් සංවර්ධනය කර ගැනීමටත් දරන උත්සාහයකි.

| |
|---|
| පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තු හා කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තු සම්බන්ධයෙන් අධීක්ෂණය හා උපදෙස් දීමේ කාර්යය ඒ ඒ කලාපවල සමාජ ඒකාග්‍රතා හා සාම අධ්‍යාපන විෂය සම්බන්ධීකරණ නිලධාරීන් , සමාජ විද්‍යා / මානව ශාස්ත්‍ර විෂය අධ්‍යක්ෂවරුන් හා ගුරු උපදේශකවරුන් වෙත පැවරේ. |

<u>ශිෂ්‍ය පාර්ලිමේන්තුව</u>

ශිෂ්‍ය පාර්ලිමේන්තුව පහත පරිදි ස්තර හතරකින් සමන්විත වේ.

- පාසල් මට්ටමින් පිහිටුවන "පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුව" (පිටුව 2 )
- අධ්‍යාපන කලාප මට්ටමින් පිහිටුවන "කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුව" (පිටුව 17)
- පළාත් මට්ටමින් පිහිටුවන" පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුව" (පිටුව 20)
- ජාතික මට්ටමින් පිහිටුවන "ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව"(පිටුව 21)

**01. පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තු පිහිටුවීම.**

1.1. සෑම පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවක් ම පාසලේ නමින් හඳුන්වනු ලැබේ. උදා- නෙලුම් පොකුණ විද්‍යාලයීය ශිෂ්‍ය පාර්ලිමේන්තුව.

දිවයිනේ සියලු ම 1 ඒබී, 1 සී හා 2 වර්ගයේ පාසල්වල 6 – 13 ශ්‍රේණිවල සිසුන්ගෙන් තෝරා ගන්නා ශිෂ්‍ය නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුව පිහිටුවනු ලැබේ.

1.2 වර්ෂයේ පළමු පාසල් වාරයේ දී පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුව පිහිටුවා අවසන් කළ යුතු වේ.

1.3. පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තු සැසි වාරයක් අවම වශයෙන් මසකට එක් වරක්වත් පැවැත්විය යුතු ය.

1.4. සෑම මසක ම අමාත්‍ය මණ්ඩලය; අගමැතිගේ ප්‍රධානත්වයෙන් ද උපදේශක කාරක සභාව, අදාළ අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ද රැස් වීය යුතු ය.

1.5 පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහලේකම් නිල බලයෙන් විදුහල්පති වේ.නියෝජ්‍ය මහලේකම් (සංවර්ධන) සඳහා විදුහලේ පුරවැසි අධ්‍යාපනය විෂයභාර ගුරුභවතා ද නියෝජ්‍ය මහලේකම් (පාලන) තනතුර සඳහා සමාජ ඒකාග්‍රතා හා සාම අධ්‍යාපන සම්බන්ධීකරණ ගුරුභවතා ද විදුහල්පති විසින් පත් කළ යුතු වේ. නියෝජ්‍ය මහලේකම් (විනය) සඳහා සුදුසු ගුරුභවතකු ද විදුහල්පති විසින් පත් කරනු ලැබිය යුතු ය.

1.6. පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ දී ඒ ඒ පාසල්වල 6 - 13 ශ්‍රේණිවල ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගෙන වගු අංක 01 අනුව කටයුතු කළ යුතු ය.

| පාසලේ 6 ශ්‍රේණිය හා ඉන් ඉහළ ශ්‍රේණිවල ශිෂ්‍ය සංඛ්‍යාව | ඡන්දයෙන් තෝරා ගත යුතු සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 6 – 9 ශ්‍රේණි | 10-13 ශ්‍රේණි | මුළු සංඛ්‍යාව |
| 2500 ට වැඩි | 60 | 90 | 150 |
| 1501 - 2500 | 40 | 80 | 120 |
| 501 - 1500 | 30 | 65 | 95 |
| 151 - 500 | 20 | 40 | 60 |
| 150 – 46 | 15 | 30 | 45 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව 45 ට අඩු පාසල්වල සියලු ම දෙනා පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිතයින් වන අතර ප්‍රධාන නිලතල සඳහා නාම යෝජනා කැඳවා ඡන්දයක් පවත්වා තෝරා ගත යුතු ය. | | |

වගු අංක 1

1.7. සටහනෙහි දැක්වෙන පරිදි ශිෂ්‍ය සංඛ්‍යාව පාසල්වල නොමැති අවස්ථාවන්හි දී එම ශිෂ්‍ය සංඛ්‍යා තෝරා ගැනීමේ අනුපාතය වෙනස් කර ගැනීමේ අවස්ථාව තිබේ. එනම් 6 – 9 තෝරා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 10 - 13 ශ්‍රේණිවලින් ද 10 -13 ශ්‍රේණිවලින් තෝරා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 6 - 9 ශ්‍රේණිවලින් ද තෝරා ගත හැකි ය. එසේත් නොමැති නම් ඒ ඒ ශ්‍රේණි කාණ්ඩවලින් තෝරා ගෙන ඇති ශිෂ්‍ය අනුපාතය සැලකිල්ලට ගනිමින් සුදුසු අනුපාතයක් මත ශිෂ්‍ය සංඛ්‍යා තීරණය කිරීමේ වගකීම විදුහල්පතිට (ශිෂ්‍ය පාර්ලිමේන්තු මහ ලේකම්) හිමිවේ. එසේ අනුපාතය සකස් කිරීමේදී 10 – 13 හෝ 10 -11 හෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වැඩි ප්‍රතිශතයක් ලැබෙන පරිදි එම අනුපාත සකස් කර ගැනීමට සැලකිලිමත් වීම ඉතා වැදගත් වේ.

1.8. මෙම ශිෂ්‍ය සංඛ්‍යා නාම යෝජනා ලබා දීම හා ඡන්දයට ඉදිරිපත් කිරීම සඳහා ඒ ඒ ශිෂ්‍යයන් ශ්‍රේණි කාණ්ඩ යටතේ වෙනස් වුව ද ශිෂ්‍ය පාර්ලිමේන්තුව සඳහා තෝරා ගන්නා මුළු නියෝජිත සංඛ්‍යාව (ඒ ඒ පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ) කිසිසේත් වෙනස් නොවිය යුතු ය.

1.9. ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයක් නොමැති අතර සමස්ත ශිෂ්‍ය නියෝජිතයින් සම සේ බෙදී යන පරිදි දෙපස එකිනෙකාට මුහුණලා සිටින සේ ආසන පැනවිය යුතු ය.

1.10. මෙය අත්‍යවශ්‍ය ඉගෙනුම් කාර්යයක් වන බැවින්, සභා වාරය සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් බැහැර පුද්ගලයින් ආරාධිතයින් ලෙස කැඳවා ගැනීමෙන් වැළැකිය යුතු ය.

## 02. පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සංයුතිය

2.1 විධායක කමිටුව (උපලේඛනය 03 බලන්න)

- මහලේකම් (විදුහල්පති)
- නියෝජ්‍ය මහලේකම් (සංවර්ධන)
- නියෝජ්‍ය මහලේකම් ( පාලන)
- නියෝජ්‍ය මහලේකම් (විනය)

2.2. පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ව්‍යුහය ( උපලේඛනය 03 බලන්න)

- කථානායක
- අග්‍රාමාත්‍ය
- සභා නායක
- නියෝජ්‍ය කථානායක
- නියෝජ්‍ය කාරක සභා සභාපති
- අමාත්‍යවරුන් දස දෙනා
- නියෝජ්‍ය අමාත්‍යවරුන් දස දෙනා
- උපදේශක කාරක සභා දහය

## 03. පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ශිෂ්‍ය අමාත්‍යාංශ

3.1පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශ දහයකි.

I. ශිෂ්‍ය චර්යා සංවර්ධනය හා ශිෂ්‍ය සුබ සාධන අමාත්‍යාංශය

ii. ශිෂ්‍ය නිපුණතා හා නව නිපැයුම් කටයුතු අමාත්‍යාංශය

iii. අන්තර් පාසල් සුහදතා ගොඩනැඟීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය

iv. අධ්‍යාපන, මානව සම්පත් සංවර්ධන හා තොරතුරු සන්නිවේදන අමාත්‍යාංශය

v. සංස්කෘතික, ආගමික කටයුතු හා සාරධර්ම ප්‍රවර්ධන අමාත්‍යාංශය

vi. සමාජ සංහිදියාව හා ශිෂ්‍ය ආරක්ෂක කටයුතු අමාත්‍යාංශය

vii. ප්‍රජා සබඳතා සංවර්ධන හා ප්‍රජා සේවා අමාත්‍යාංශය

viii. සෞඛ්‍ය, පෝෂණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය

ix. කෘෂිකර්ම හා පරිසර සංවර්ධන අමාත්‍යාංශය

x. භෞතික සම්පත් සංවර්ධන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

3.2.ශිෂ්‍ය සංඛ්‍යාව 45 ට අඩු පාසල්වල අමාත්‍යාංශ ඒකාබද්ධ කර පාසලේ අවශ්‍යතාවට අනුව සකස් කර ගත හැකි ය.

3.3.මෙම ශිෂ්‍ය අමාත්‍යාංශ දහයට අමතර ව ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය පිළිබඳ අමාත්‍යාංශ කාර්යභාරය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අග්‍රමාත්‍යවරයාට නිල බලයෙන් පැවරේ.

3.4. එම අමාත්‍ය තනතුරට අතිරේක ව  ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අග්‍රමාත්‍යවරයා එම පාර්ලිමේන්තුවේ මුදල් මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් ද කටයුතු කරයි.

3.5.පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මූල්‍ය කටයුතු පාලනය සඳහා මූල්‍ය මණ්ඩලයක් පිහිටවනු ලැබේ. එම මූල්‍ය මණ්ඩලය පහත තනතුරුවලින් සමන්විත වේ. මූල්‍ය මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කතානායකවරයා කටයුතු කරන අතර එහි ලේකම්වරයා වශයෙන් අග්‍රමාත්‍යවරයා කටයුතු කරයි. නියෝජ්‍ය කතානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති, සභානායක මෙම මූල්‍ය මණ්ඩලයේ සෙසු සමාජිකයන් වශයෙන් කටයුතු කරනු ලැබේ. මෙම මූල්‍ය මණ්ඩලයේ උපදේශකවරයා වශයෙන් ශිෂ්‍ය පාර්ලිමේන්තු මහලේකම්වරයා වන විදුහල්පති විසින් නම් කරන ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජ්‍ය මහ ලේකම් (පාලන) කටයුතු කරනු ලැබේ.

**04**. **උපදේශක කාරක සභා**

4.1 අමාත්‍යාංශය දහය නමින් ම උපදේශක කාරක සභා දහය ක්‍රියාත්මක වේ.

4.2 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නිල නොදරන සෙසු නියෝජිතයන් ඔවුන්ගේ කුසලතා පදනම මත එක් එක් උපදේශක කාරක සභාව සඳහා විදුහල්පති ප්‍රමුඛ කමිටුව විසින් ම පත් කරනු ලැබිය යුතුය.  (7.1.4)

**05**. **පාසලේ සෙසු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ක්‍රියාකාරී දායකත්වය**

5.1. අමාත්‍යාංශවල සක්‍රිය ක්‍රියාකාරීත්වය සඳහා පාසලේ සියලූ ම ශිෂ්‍ය  ශිෂ්‍යාවන් ඒ සඳහා  ඔවුන්ගේ කැමත්ත හෝ පාසලට අභිමත ක්‍රමවේද හෝ අනුගමනය කළ යුතුය.  අදාළ වැඩසටහන් දහයට බෙදා වෙන් කළ යුතුය.

ශිෂ්‍ය සංඛ්‍යා පහත වගු අංක 2 ට අනුව  සමාන ව බෙදා වෙන් කිරීම සුදුසු ය. මෙම වැඩසටහන් දහය අදාළ අමාත්‍යාංශ යටතේ එම නමින් ම ක්‍රියාත්මක වේ. (වැඩසටහන් හතරෙහි සංයුතිය උපලේඛන 4 හි දැක්වේ.)

5.2. ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ  සම්මත වන යෝජනා හා ඒ ඒ අමාත්‍යාංශවලට පැවරෙන කාර්ය විධිමත් පරිදි ක්‍රියාවට නැංවීම  එම වැඩසටහනට අදාළ කණ්ඩායම විසින් සිදු කරනු ලැබිය යුතු ය.

5.3. විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විධිමත් පරිදි පාසලේ ක්‍රියාවට නැංවීම සඳහා යෝජනා කරන එම වැඩසටහන් ඒ ඒ අමාත්‍යාංශවලට යොමුකොට ක්‍රියාවට නැංවිය යුතු ය.

| | වැඩසටහන | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ශිෂ්‍ය චර්යා සංවර්ධනය හා ශිෂ්‍ය සුබ සාධන වැඩසටහන | | | | | | | | |
| 2 | ශිෂ්‍ය නිපුණතා හා නව නිපැයුම් කටයුතු වැඩසටහන | | | | | | | | |
| 3 | අන්තර් පාසල් සුහදතා ගොඩනැඟීමේ හා සංවර්ධනය කිරීමේ වැඩසටහන | | | | | | | | |
| 4 | අධ්‍යාපන, මානව සම්පත් සංවර්ධන හා තොරතුරු සන්නිවේදන වැඩසටහන | | | | | | | | |
| 5 | සංස්කෘතික, ආගමික කටයුතු හා සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන | | | | | | | | |
| 6 | සමාජ සංහිදියාව හා ශිෂ්‍ය ආරක්ෂක කටයුතු වැඩසටහන | | | | | | | | |
| 7 | ප්‍රජා සබඳතා සංවර්ධන හා ප්‍රජා සේවා වැඩසටහන | | | | | | | | |
| 8 | සෞඛ්‍ය, පෝෂණ හා ක්‍රීඩා කටයුතු වැඩසටහන | | | | | | | | |
| 9 | කෘෂිකර්ම හා පරිසර සංවර්ධන වැඩසටහන | | | | | | | | |
| 10 | භෞතික සම්පත් සංවර්ධන හා ආපදා කළමනාකරණ වැඩසටහන | | | | | | | | |

වගු අංක 02

මෙම එක් එක් වැඩසටහන සඳහා වැඩසටහන් නියාමකවරයකු හා වැඩසටහන් සම්බන්ධීකාරක ශිෂ්‍යයකු පත් කර ගත යුතු වේ.

## 06. පාසලේ සියලු ම ගුරුවරුන්ගේ ක්‍රියාකාරී දායකත්වය

6.1 පාසලේ ආචාර්ය මණ්ඩලයේ සියලු ම සමාජිකයන් තමා උගන්වන විෂය, සුවිශේෂී හැකියා, දක්ෂතා, ප්‍රමිති ක්ෂේත්‍රය හා පාසලේ පැවරී ඇති වගකීම් අනුව ඔවුන්ගේ කැමැත්ත මත මෙම එක් එක් අමාත්‍යාංශ හා වැඩසටහන් සඳහා බෙදා, වගකීම් පැවරිය යුතු ය.

6.2 එම ගුරු මණ්ඩලය වැඩසටහන්වල උපදේශක මණ්ඩලය ලෙස කටයුතු කරනු ඇත. ස්වකීය ගුරු කාර්යය සාධන පත්‍රිකාවේ විෂය සමගාමී ක්ෂේත්‍රය යටතේ තම දායකත්වය සඳහන් කළ යුතු ය.

## **07**. පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවට ශිෂ්‍ය නියෝජිතයන් තෝරා පත්කර ගැනීම හා නාම යෝජනා කැඳවීම

### **7.1** ශිෂ්‍ය නියෝජිතයන් තෝරා පත් කර ගැනීම

7.1.1 පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවට ශිෂ්‍ය නියෝජිතයින් තෝරා ගැනීමට 6 - 13 ශ්‍රේණි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් වගු අංක 01 අනුව නාම යෝජනා කැඳවිය යුතු ය. මෙහි දී 1.7 හා,1.8 වගන්ති කෙරෙහි ද අවධානය යොමු කිරීමට කටයුතු කරන්න, සමහර පාසල්වල 10-11 හෝ 10-13 හෝ ශ්‍රේණිවල ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම නිසා ඉහත වගුව 01 හි සඳහන් ආකාරයට ශිෂ්‍යයන්ගෙන් නාම යෝජනා ලබා ගැනීම හෝ ශිෂ්‍ය නියෝජිතයින් තෝරා ගැනීම හෝ පිළිබඳ ගැටලු මතු විය හැකි ය.

එවැනි අවස්ථාවක දී ඒ ඒ ශිෂ්‍ය කාණ්ඩවලින් තෝරා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 10-11 හෝ 10- 13 හෝ කාණ්ඩයෙන් ද 10-11 හෝ 10-13 කාණ්ඩවලින් නාම යෝජනා දී තෝරා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 6-9 කාණ්ඩයෙන් තෝරාගත හැකිය.

එය ද ගැටලුවක් වන්නේ නම් විදුහල්පතිවරයාගෙන් අභිමතය පරිදි වගුව අංක 01 හි දැක්වෙන ශිෂ්‍ය අනුපාතයන්ට සමපාත ව ඒ ඒ කාණ්ඩ වලින් නාම යෝජනා ලබා දී හා ඡන්දයට ඉදිරිපත් කිරීම සඳහා ශිෂ්‍ය සංඛ්‍යාව තීරණය කළ හැකි ය.

එසේ ශිෂ්‍ය අනුපාතයන් සකස් කර ගැනීමේ දි 10-11 හෝ 10-13 හෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන් බහුතර නියෝජනයට ඉඩකඩ සැලසෙන පරිදි එම අනුපාත තීරණය කිරීමට කටයුතු කළ යුතු ය.

කෙසේ වෙතත් පාසලේ 6-13 ශිෂ්‍ය සංඛ්‍යාව මත පදනම්ව ශිෂ්‍ය පාර්ලිමේන්තුව සඳහා තෝරා ගන්නා මුළු ශිෂ්‍ය නියෝජිත සංඛ්‍යාව කිසිසේත් වෙනස් නොවිය යුතු ය.

පාසලේ 6-13 ශ්‍රේණිවල ශිෂ්‍ය සංඛ්‍යාව මෙම වගුවේ අනුපාතවලට අනුකූල නොවන අවස්ථාවල දී ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ විධායක කමිටුවේ අභිමතය පරිදි ඉහත අනුපාත වෙනස් කර ගත හැකි ය.

එහෙත් ඡන්දෙන් තෝරා ගත යුතු මුළු නියෝජිත සංඛ්‍යාව වෙනස් නොවිය යුතු ය. 6-13 ශ්‍රේණිවල ඉගෙනුම ලබන ඕනෑම ශිෂ්‍යයකුට ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිතයකු වීම සඳහා නාම යෝජනා ලබා දීමට අවස්ථාව සැලසේ.

### 7.1.2 නාම යෝජනා කැඳවීම

| 6-13 ශිෂ්‍ය සංඛ්‍යාව | නාම යෝජනා<br>කැඳවිය යුතු ගණන | | | ඡන්දයෙන් තෝරා ගත යුතු ගණන | | |
|---|---|---|---|---|---|---|
| | 6 - 9 | 10-13 | මුළු ගණන | 6 - 9 | 10-13 | මුළු ගණන |
| 2500 ට වැඩි | 90 | 135 | 225 | 60 | 90 | 150 |
| 1501 - 2500 | 60 | 120 | 180 | 40 | 80 | 120 |
| 501 - 1500 | 45 | 100 | 145 | 30 | 65 | 95 |
| 151 - 500 | 30 | 60 | 90 | 20 | 40 | 60 |
| 150-46 | 20 | 40 | 60 | 15 | 30 | 45 |
| | ශිෂ්‍ය සංඛ්‍යාව 45 ට අඩු පාසල්වල සියලු ම දෙනා පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිතයින් වන අතර ප්‍රධාන නිලතල සඳහා නාම යෝජනා කැඳවා ඡන්දයක් පවත්වා තෝරා ගත යුතු ය. | | | | | |

වගු අංක 3

7.1.2 උපලේඛන අංක 01 ඇති ආකෘතිය පදනම් කර ගනිමින් සාම්ප්‍රදායික නායකත්වයට පරිබාහිර දක්ෂතා පෙන්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් පවා යොමු කර ගැනීමට සුදුසු නිර්ණායක ඇතුළත් නාම යෝජනා පත්‍රයක් පාසලට අභිමත පරිදි සකස් කර ගත හැකි ය.

7.1.3. එම ආකෘති පත්‍රය පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමෙන් අනතුරු ව නාම යෝජනා ලබා දීම සඳහා ඉදිරිපත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් එම නාම යෝජනා පත්‍රය තම අත් අකුරෙන් ම පිටපත් කර සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු වේ.

7.1.4. නාම යෝජනා භාර ගැනීම සඳහා පස් දෙනකුගෙන් සමන්විත නාම යෝජනා මණ්ඩලයක් විදුහල්පතිවරයා විසින් පහත පරිදි නම් කරනු ලැබිය යුතු ය.

- විදුහල්පති / ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පති
- නියෝජ්‍ය විදුහල්පතිවරයෙක්
- ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම්වරුන් ලෙස පත්වීමට නියමිත ගුරුභවතුන් තිදෙනා ( අංක 1.5 සඳහන් පරිදි)

7.1.5. නාම යෝජනා ලබා දීමේ අවසන් දිනය හා වේලාව නිවේදනය කළ යුතු වන අතර නාම යෝජනා භාර ගන්නා අවසන් දිනයෙන් හා වේලාවෙන් පසු කිසිදු නාම යෝජනාවක් භාර නොගත යුතු ය.

7.1.6. මෙම නාම යෝජනා සලකා බැලීමේ දී පොදු ලකුණු දීමේ පටිපාටියක් අනුගමනය කළ යුතු වේ. ලකුණු ලබාදීමේ දී අයදුම් පත්‍රයේ සැකස්ම, ක්‍රමවත් බව, පැහැදිලි බව වැනි කරුණු සලකා බලා පොදු ලකුණක් ප්‍රදානය කිරීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය.

7.1.7. ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉදිරිපත් කරන නාම යෝජනා පත්‍රවලට ලකුණු ලබාදීමෙන් අනතුරු ව ඒවා ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ලබා දී ඒවා අධ්‍යයනය කිරීමේ අවස්ථා උදා කර ඔවුන්ට ලකුණු අඩු වීමේ අවස්ථා අවබෝධ කර පසු අවස්ථාවන්හි දී අඩුපාඩු මග හරවා ගැනීම සඳහා අවස්ථා නිර්මාණය කිරීමට කටයුතු කළ යුතු ය.

7.1.6. ශිෂ්‍ය අපේක්‍ෂක අපේක්‍ෂිකාවන් ඉදිරිපත් කරන නාම යෝජනා සලකා බලා පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුව නියමිත නාම යෝජනා සංඛ්‍යාව තෝරා ගැනීම නාම යෝජනා මණ්ඩලයේ වගකීම වේ.

7.1.7. නාම යෝජනා මණ්ඩලය තෝරා ගන්නා ලද ඡන්ද අපේක්‍ෂකයන්ගේ 6 -9 ශ්‍රේණි නාම ලේඛනය අකාරාදි පිළිවෙළට සකසා අංක 01 සිට 90 දක්වා අංක ලබා දිය යුතු අතර 10-13 ශ්‍රේණි නාම ලේඛනය අකාරාදි පිළිවෙළට සකසා අංක 101 සිට ඉදිරියට අංක ලබා දිය යුතු ය. සුදුසුකම් ලත් සියලු ම අපේක්ෂකයන් මැතිවරණ ක්‍රියාවලියේ දී හා වෙනත් අවස්ථාවල දී ක්‍රියා කළ යුතු ආකාරය හා පිළිපැදිය යුතු ආචාර ධර්ම පිළිබඳ ව ආචාර ධර්ම පද්ධතියක් සකස් කර ඒ පිළිබඳ ශිෂ්‍ය අපේක්ෂකයන් ඇතුළු සියලු ම ශිෂ්‍යයන් හා ගුරුවරුන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු ය.
නාම යෝජනා කැඳවීම නිවේදනය කර සතියක් තුළ නාම යෝජනා භාර ගැනීම අවසන් කළ යුතු ය.

7.1.8. නාම යෝජනා මණ්ඩලය විසින් තෝරා ගන්නා ලද ඡන්ද අපේක්‍ෂකයන්ගේ නාම ලේඛනය අකාරාදි පිළිවෙළට සකසා අංක ලබා දී පාසලේ ප්‍රදර්ශනය කළ යුතු ය.

7.1.9 නාම යෝජනා භාර ගැනීමෙන් පසු සති දෙකක් තුළ පාසල පවත්වන දිනයක ඡන්දය පැවැත්විය යුතු ය.

## 8. ඡන්ද ප්‍රචාරක කටයුතු

8.1.1. පාසලේ දැන්වීම් පුවරු කිහිපයක් / ස්ථාන කිහිපයක් සකස් කර දී තමා පිළිබඳ කෙටි විස්තරයක් ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට අවස්ථාව සලසා දිය යුතු ය. ප්‍රදර්ශනයට පෙර විදුහල්පති හෝ විදුහල්පති නම් කරන නියෝජ්‍ය මහ ලේකම්වරයකුගේ හෝ ලිඛිත අනුමතිය අනිවාර්යයෙන් ම ලබා ගත යුතු ය.

8.1.2. ඡන්දය ඉල්ලීම සඳහා ප්‍රචාරක උපක්‍රම ලෙස පෝස්ටර් ප්‍රදර්ශනය හා පත්‍රිකා බෙදා හැරීම පාසල් පරිශ්‍රයට පමණක් සීමා විය යුතු අතර ඒවා මුද්‍රිත ඒවා නොවිය යුතු ය. එය විදුහල්පතිවරයාගේ හෝ ඔහු විසින් නම් කරන නියෝජ්‍ය මහ ලේකම්වරයකුගේ හෝ අනුමතිය මත සිදු විය යුතු ය. චක්‍රලේඛයට පටහැනි ව හා විනය විරෝධී ව කටයුතු කරන සෑම අවස්ථාවක දී ම ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් ( විනය) ගේ ප්‍රධානත්වයෙන් යුත් විනය කමිටුවක් හමුවට පමුණුවා සුදුසු පියවර ගැනීමේ බලය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වශයෙන් විදුහල්පතිවරයාට පැවරේ. අවසාන වශයෙන් අපේක්ෂකත්වය අහෝසි කිරීම දක්වා ද කටයුතු කිරීමට පියවර ගත හැකි ය.

8.1.3. ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සියලු කටයුතු පාසලේ සාමාන්‍ය නීති රීති හා සම්ප්‍රදායන්ට යටත් වන අතර ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සියලු කටයුතු වඩාත් විනය ගරුක ව හා ආචාරශීලී ව පවත්වාගෙන යාම

සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කාර්යයන් හා සම්බන්ධ ව සකස් කරන ආචාර ධර්ම පද්ධතිය තුළින් සලසා ගැනීමේ වගකීම විදුහල්පති ප්‍රමුඛ විධායක කමිටුවට පැවරේ.

## 9. <u>නාම යෝජනා භාර දීමෙන් පසු පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවට ඡන්දය ඉල්ලීම</u>

9.1 ශිෂ්‍ය පාර්ලිමේන්තු ඡන්දය සඳහා තෝරා ගනු ලබන සියලු ම ඡන්ද අපේක්ෂකයන්ට උදෑසන රැස්වීම හෝ මාධ්‍ය ඒකකය හෝ භාවිත කරමින් තමා පිළිබඳ හඳුන්වා දෙමින් ශිෂ්‍යයන් ඇමතීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය. ඒ සඳහා විධිමත් වැඩසටහනක් විදුහල්පතිගේ අභිමතය පරිදි සකස් කර ගත හැකි ය.

9.2 ඡන්ද ප්‍රචාරක කටයුතු කිරීමේ දී පෝස්ටර්, අත්පත්‍රිකා ආදිය මුද්‍රණය කිරීම හෝ මුද්‍රණය කර බෙදා හැරීම හෝ සපුරා තහනම් වන අතර ත්‍යාග දීම, පොරොන්දු දීම නොකළ යුතු අතර එම කාර්යයන්හි නිරත වන්නේ නම් 8.1.2 වගන්තියේ පැහැදිලි කරන පරිදි අපේක්ෂකත්වය අහෝසි කිරීම දක්වා දඬුවම් ලැබිය හැකි වරදකි.

9.3 සිය ඡායාරූපය ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව සහිත ශිෂ්‍ය නියෝජිතයන් තම ඡායාරූපය පාසලේ නිර්මාණශීලී කුසලතාවන්ගෙන් හෙබි ශිෂ්‍ය ශිෂ්‍යාවන් මගින් නිර්මාණය කරවා ගෙන ප්‍රදර්ශනය කළ හැකි ය. එම නිර්මාණ ද පාසලෙන් බැහැර පුද්ගලයන් ලවා නිර්මාණය කර ගැනීම කිසිසේත් නොකළ යුතු ය. ඡන්දය ඉල්ලා බෙදාහරින අත් පත්‍රිකා සිය අත් අකුරෙන් ලියන ලද පත්‍රිකා විය යුතු අතර ඒවා කවර ලෙසකින් හෝ මුද්‍රණය නොකළ ඒවා විය යුතු ය.

9.4 මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමත් සමග ශිෂ්‍ය නියෝජිතයන් සඳහා පාසලට අනන්‍ය වූ ආචාර ධර්ම පද්ධතියක් සකස් කර ගැනීමට කටයුතු කළ යුතු ය.

## 10 ඡන්දය පැවැත්වීම

10.1. මැතිවරණය ප්‍රකාශයට පත් කළ දින සිට, විදුහල්පති, නිල බලයෙන් මැතිවරණ කොමසාරිස් වන අතර ගුරුභවතුන් අතුරින් මැතිවරණ කාර්ය මණ්ඩලයක් පත් කිරීම ඔහුගේ කාර්ය භාරයකි.

10.2. ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීමේ ක්‍රියාවලිය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ හා මැතිවරණ දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගත හැකි ය. ඒ සඳහා පාසල පිහිටි දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරයා සම්බන්ධීකරණයෙන් එම සහාය පහසුවෙන් ම ලබා ගත හැකි වනු ඇත.

10.3 ඡන්දය පැවැත්වීම, පාසලේ පොදු ස්ථානයක හෝ ස්ථාන කිහිපයක හෝ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මැතිවරණ සම්ප්‍රදාය අනුව සිදු කළ යුතු ය.

10.4 (අ) ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා එක සමාන ඡන්ද පත්‍රිකාවක් ඡන්දදායක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දිය යුතු ය.

(ආ) එම ඡන්ද පත්‍රිකාව වලංගු ඡන්ද පත්‍රිකාවක් බවට පත් කිරීම සඳහා පත්‍රිකාවේ එක් පසෙක නිල මුද්‍රාව සහිත ව විදුහල්පතිගේ හෝ විදුහල්පති විසින් බලය පවරන ගුරුවරයාගේ හෝ අත්සන තැබිය යුතු ය. අනෙක් පස, පාසලේ ඡන්දදායකයන් වන 6 ශ්‍රේණිය හා ඉන් ඉහළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට භාවිත කළ යුතු ය.

(ඇ) ඡන්දය ප්‍රකාශ කරන ස්ථානයේ අපේක්ෂකයින්ගේ නම් හා අංක ප්‍රදර්ශනය කළ යුතු ය.

10.5. ශිෂ්‍ය පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වශයෙන් විදුහල්පතිගේ හෝ ඔහු විසින් බලය පවරන නියෝජිතයකුගේ හෝ අත්සන හා නිල මුද්‍රාව නොමැති විට එය නිල ඡන්ද පත්‍රිකාවක් වශයෙන් නොසැලකේ.

10.6. පාසලේ 6 ශ්‍රේණියෙන් ඉහළ (6 ශ්‍රේණිය ද ඇතුළත් ව) සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඡන්දය දීමට සුදුසුකම් ලබන අතර එක් අයකුට මනාප දෙකක් හිමි වේ.
(අ). මෙම මනාප දෙකෙන් එක් මනාපයක් 6 – 9 ශ්‍රේණිවලින් ඡන්දය ඉල්ලන අපේක්ෂකයකුට ද අනෙක් මනාපය 10– 13 හෝ 10 -13 හෝ ශ්‍රේණි කාණ්ඩවලින් ඡන්දය ඉල්ලන අපේක්ෂකයකුට ද ලබාදිය යුතු වේ.

(ආ) මෙම මනාප දෙක ම එකම ශ්‍රේණි කාණ්ඩයක ( 6 – 9 හෝ 10 -11,10 -13 ) ඡන්ද අපේක්ෂකයකුට ලබා දී තිබුණහොත් එම ඡන්දය ප්‍රතික්ෂේපිත ඡන්දයක් සේ සලකුණු ලැබේ.

## 11 . <u>ඡන්දය ප්‍රකාශ කිරීම</u>

11.1. පාසලේ 6-13 ශ්‍රේණිවල සියලු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ඇත.

11.2. එක් ශිෂ්‍යයකුට හෝ ශිෂ්‍යාවකට හෝ මනාප දෙකක් හිමිවේ.

11.3. ඡන්දයේ වලංගුභාවය සඳහා මනාප දෙක ම භාවිත කළ යුතු අතර එම මනාප දෙක 6-9 හා 10 -13 ශ්‍රේණි කාණ්ඩ දෙකේ අපේක්ෂකයන් දෙදෙනකුට ලබා දී තිබිය යුතුය.

11.4 එක ම කාණ්ඩයට මනාප දෙක ම ලබා දීම හෝ එක් මනාපයක් පමණක් ප්‍රකාශ කිරීම හෝ එම ඡන්දය අවලංගු වීමට හේතු වේ.

## 12 **ඡන්දය ගණන් කිරීම හා ශිෂ්‍ය නියෝජිතයන් තෝරා ගැනීම.**

12.1 ඡන්ද ගණන් කිරීම සඳහා සාමාන්‍ය මැතිවරණයක ඡන්දය ගණන් කිරීමේ ක්‍රමවේද අනුගමනය කළ යුතු ය.

12.2 ඡන්ද ගණන් කිරීමේ දී ඒ ඒ අපේක්ෂකයා ලබා ගත් ඡන්ද, සටහන් කිරීම සඳහා 6 - 9 ශ්‍රේණි අපේක්ෂකයන් සඳහා වෙන ම සාරාංශ පත්‍රිකාවක් ද 10 -11 හෝ 10 – 13 හෝ ශ්‍රේණි අපේක්ෂකයන් සඳහා වෙන ම සාරාංශ පත්‍රිකාවක් ද සකස් කළ යුතු ය.

12.3 . ඡන්දය ගණන් කර අවසන් වීමෙන් පසු ව පාසලේ 6 – 13 හෝ 6 -11, 6-13 හෝ ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගෙන වගුව අංක 01 ට අනුව ඒ ඒ ශ්‍රේණි කාණ්ඩ අනුව ශිෂ්‍ය නියෝජිතයන් සංඛ්‍යාව තෝරා පත් කර ගත යුතු ය. තේරී පත් නොවන ශිෂ්‍ය අපේක්ෂකයන්ගේ නාම ලේඛනය ලබා ගත් ඡන්ද සංඛ්‍යාව අනුව අනුපිළිවෙලින් සකස් කර අවශ්‍ය අවස්ථාවල දී භාවිත කිරීම සඳහා සුරක්ෂිත ව තබා ගත යුතු වේ.

12.4 ඡන්දය ගණන් කර අවසන් ප්‍රතිඵල වාර්තාව විදුහල්පතිවරයාට ලැබීමෙන් පසු ඔහු විසින් පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවට තේරී පත් වන නියෝජිතයන්ගේ නම් ප්‍රකාශ කර ප්‍රදර්ශනය කළ යුතු ය.

12.5 ඡන්දය නිම වී ප්‍රතිඵල ප්‍රකාශ කිරීමෙන් පසු ව මංගල සැසිවාරයට දින නියම කිරීම විදුහල්පති සතු වගකීමකි.අනතුරු ව අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය තනතුරු සඳහා අපේක්ෂිත නියෝජිතයන්ගෙන් ඉල්ලුම් පත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

12.6 එම අයදුම්පත් සඳහා කුසලතා පදනම මත ලකුණු ලබා දී ඒ ඒ අමාත්‍යාංශ සඳහා ඉල්ලුම් කළ නියෝජිතයන් ලබා ගත් ලකුණු අවරෝහණ ක්‍රමයට සකස් කර ගත් ලේඛනයක් මංගල සැසි වාරයට පෙර පිළියෙළ කළ යුතු ය.

## 13 ප්‍රධාන තනතුරු , සෙසු තනතුරු හා කමිටු සඳහා සාමාජිකයින් පත්කිරීම

13.1 ප්‍රධාන තනතුරු සඳහා සුදුසු නියෝජිතයන් තෝරා ගැනීමේ අවස්ථාව ශිෂ්‍ය පාර්ලිමේන්තුවට තේරී පත් වූ නියෝජිතයන්ට හිමි වේ.

13.2. එම තනතුරුවල කාර්යභාරය හා වගකීම ගැන පූර්ණ දැනුවත් කිරීමක් පාර්ලිමේන්තු මහ ලේකම් විසින් සිදු කරනු ලැබිය යුතු ය.

13.3 එම දැනුවත් කිරීමෙන් පසු මංගල සභා වාරයට පෙර වැඩමුළුවක් පවත්වා සුදුසු අය නම් කර ගැනීමට ශිෂ්‍ය නියෝජිතයන්ට අවස්ථාව ලබා දීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ.

13.4 නියෝජ්‍ය කථානායක, අග්‍රාමාත්‍ය, සභානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති යන ප්‍රධාන නිල හතර ශිෂ්‍ය නියෝජිතයන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් තෝරා පත් කර ගත යුතු ය.

## 14 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිත ධුර පුරප්පාඩු වීම

14.1 ශිෂ්‍ය නියෝජිතයා පාසලේ ඉගෙනුම අවසන් කිරීම, පාසල හැරයාම, වෙනත් පාසලකට ඇතුළත් වීම, තුන් මාසයකට වඩා විදේශගත වීම, ශිෂ්‍ය පාර්ලිමේන්තු ආචාර්ය ධර්මවලට පටහැනි ව කටයුතු කිරීම හෝ ශිෂ්‍ය පාර්ලිමේන්තු මහ ලේකම්වරයා, නියෝජ්‍ය මහ ලේකම්වරුන් තීරණය කරන විනය විරෝධී කටයුත්තක් කිරීම හෝ යන කරුණු හේතුවෙන් ශිෂ්‍ය පාර්ලිමේන්තුවෙන් ඉවත් කළ හැකි ය.

14.2 පුරප්පාඩු වූ ශිෂ්‍ය නියෝජිත තනතුර පිරවීම

ශිෂ්‍ය පාර්ලිමේන්තුවල ඡන්දය පැවැත්වීමේ දී නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගෙන ඡන්දයට ඉදිරිපත් වූ අනෙකුත් ශිෂ්‍ය අපේක්ෂකයින් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව මත අනුපිළිවෙළට සකස් කරන ලද ලේඛනයේ පුරප්පාඩු වන තනතුරු සඳහා නියෝජිතයින් ප්‍රමුඛතා අනුපිළිවෙළ මත පත්ගත යුතු ය.

## 15. ප්‍රධාන තනතුරු සඳහා නියෝජිතයන් තෝරා ගැනීම

15.1. ප්‍රධාන තනතුරු සඳහා සුදුසු ශිෂ්‍ය නියෝජිතයන්, ශිෂ්‍ය නියෝජිතයන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් තෝරා පත් කර ගත යුතු ය.

15.2 මෙම අවස්ථාව ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයන්ට මංගල සැසිවාරයේ දී ලබා දිය යුතු ය.

15.3. කිසියම් තනතුරකට එක් අයකුට වඩා යෝජනා ස්ථිර වූ විට රහස් ඡන්දයක් පවත්වා එක් අයකු තෝරා ගත යුතු ය.

## 16 . <u>ශිෂ්‍ය මන්ත්‍රීවරුන්ට ආසන පැනවීම</u>

16.1. ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම් දිනයේ දී සෑම මන්ත්‍රීවරයකුට ම අසුනක් බැගින් වෙන් කර දෙන තුරු සභා සීමාවේ කවර ආසනයක වුව ද ශිෂ්‍ය මන්ත්‍රවරයකුට අසුන් ගත හැකි ය.

16.2 කථානායකවරයා විසින් සෑම මන්ත්‍රීවරයකුට ම ආසනයක් වෙන් කර දිය යුතු ය.

16.3. ශිෂ්‍ය පාර්ලිමේන්තුවල විපක්ෂයක් නොමැති අතර පාර්ලිමේන්තුව නියෝජනය කරන එක් එක් නියෝජිතයන් සම සම ව දෙකට බෙදෙන සේ දෙපස මුහුණට මුහුණලා සිටින අයුරින් ආසන සකස් කළ යුතු වේ.

16.4. ජයග්‍රහණය කළ අපේක්ෂකයින් ගැහැනු පිරිමි වශයෙන්, ශ්‍රේණි මට්ටමින්, ආරෝහණ පිළිවෙළට වෙන වෙන ම තබා එක දෙක වශයෙන් ගණන් කර එක ලැබුණු නියෝජිතයන් එක් පැත්තකට ද දෙක ලැබුණු නියෝජිතයින් දෙවන පැත්තට ද අසුන් ගැනීමට සැලැස්විය හැකි ය.

## 18. මංගල සැසිවාරය හා දිවුරුම් දීම

18.1. ප්‍රධාන තනතුරු සඳහා සුදුසු නියෝජිතයන් යෝජනා ස්ථිරත්වයෙන් පත් කර ගැනීමේ අවස්ථාව ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයන්ට මංගල සැසිවාරයේ දී ලබා දිය යුතු ය. කිසියම් තනතුරකට එක් අයකුට වඩා යෝජනා ස්ථිර වූ විට රහස් ඡන්දයක් පවත්වා එක් අයෙකු තෝරා ගත යුතු ය.

18.2. කථානායක තනතුර ප්‍රථමයෙන් සම්මත කරගෙන පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඉදිරියේ දිවුරුම් දිය යුතු ය.

18.3. අනෙකුත් මන්ත්‍රීවරුන් ද කථානායක ඉදිරියේ දිවුරුම් දිය යුතු ය.

18.4. අනෙකුත් ප්‍රධාන නිල හතරට තේරී පත් වන නියෝජිතයන් ඉන් අනතුරු ව දිවුරුම් දිය යුතු ය.

18.5. අමාත්‍ය තනතුරු සඳහා අයදුම් කළ නියෝජිතයන් ලබා ගත් ලකුණු අනුව සකස් කළ ලේඛනයෙන් මෙම ප්‍රධාන තනතුරු ලබා ගත් ශිෂ්‍යයන් වෙත් නම් ඔවුන් ඉවත් කර ලේඛනයේ ඉහළ ම ලකුණු ලබා ගත් නියෝජිතයන් අමාත්‍යවරුන් ලෙස ද දෙවනු ව ලකුණු ලබා ගත් නියෝජිතයන් නියෝජ්‍ය අමාත්‍යවරුන් ලෙස ද ප්‍රකාශයට පත් කළ යුතු ය.

18.6. තේරී පත්වන අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් දිවුරුම් දීම පාසලේ ප්‍රධාන රැස්වීමක දී පාර්ලිමේන්තු මහලේකම් ඉදිරියේ දී කළ යුතු ය.

## 19 සැසිවාර පැවත්වීම හා පාර්ලිමේන්තුව පවත්වා ගෙන යාම

19.1 මසකට වරක් පාර්ලිමේන්තු සැසිවාරයක් පැවත්විය යුතු අතර ඒ සඳහා පාසල් වේලාව සුදුසු පරිදි කළමනාකරණය කර ගැනීම විදුහල්පතිගේ වගකීමකි. එසේ කළ නොහැකි අවස්ථාවල දී පාසල් වාරයකට එක් සැසිවාරයක් හෝ පැවැත්විය යුතු ය.

19.2 සැසිවාරයක් සඳහා ශිෂ්‍ය නියෝජිතයන්ගෙන් තුනෙන් දෙකක ඝන පූර්ණයක් තිබිය යුතු ය .

19.3. පාර්ලිමේන්තු සැසිවාරයක් සඳහා වන න්‍යාය පත්‍රය සැකසීම පාර්ලිමේන්තු මහලේකම්ගේ උපදෙස් පරිදි නියෝජ්‍ය මහලේකම් (සංවර්ධන) විසින් සිදු කළ යුතු ය. එහි දී ඒ දක්වා ඉදිරිපත් වී ඇති යෝජනා සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතු ය.

19.4. පාසලේ ඕනෑ ම සිසුවකුට පාර්ලිමේන්තුවේ නියෝජිතයකු මඟින් පාර්ලිමේන්තු මහලේකම් වෙත ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සාකච්ඡා කර ක්‍රියාවට නැඟිය හැකි යෝජනා ලිඛිත ව ඉදිරිපත් කළ හැකි ය.

19.5. න්‍යාය පත්‍රයට ඇතුළත් වන යෝජනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවස්ථාව ද එම නියෝජිතයාට ම ලබා දිය යුතු ය.

19.6 එසේ ඉදිරිපත් වන යෝජනා සැලකිල්ලට ගනිමින් නියමිත සභා වාරය සඳහා සාකච්ජාවට ගනු ලබන යෝජනා ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ විධායක කමිටුව විසින් තීරණය කර අදාළ යෝජනාව හෝ යෝජනා කිහිපය හෝ සාකච්ජා කරන දිනය, වේලාව, යෝජනාව ඉදිරිපත් කරන කථිකයාට ලබා දෙන කාලය හා වේලාව, ඒ සඳහා අදහස් දැක්වීමට ඉදිරිපත් වන අනෙකුත් කථිකයන් සංඛ්‍යාව හා

ඔවුන්ට ලබා දෙන කාලය තීරණය කර එම මාතෘකාව හෝ මාතෘකා කිහිපය හෝ සඳහා කථිකයන් තෝරා ගැනීමේ අවස්ථාව සභා නායක ශිෂ්‍යයාට පැවරිය යුතු ය.

19.7. සභානායකවරයා ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ශිෂ්‍ය නියෝජිතයන් අසුන් ගෙන සිටින දෙපැත්තට ම සම බර වන සේ ඒ ඒ යෝජනාවට කථිකයන් නම් කර ගෙන අදාළ එක් එක් යෝජනාව යටතේ අදහස් දක්වන ශිෂ්‍ය නියෝජිතයන්ගේ ලේඛනය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඇතුළු විධායක කමිටුවට ලබා දී අනුමතිය ලබා ගත යුතු වේ.

19.8. සභා වාරයේ දී ඉදිරිපත් වන යෝජනා විවාදයට ලක් කිරීමෙන් අනතුරු ව සංශෝධන ඇත්නම් ඒවා ද සහිත ව සම්මත වන යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාළ විෂය භාර අමාත්‍යාංශයට අවස්ථාව ලබා දිය යුතු ය.

19.9. එම යෝජනා අදාළ අමාත්‍යාංශය හා වැඩසටහන් භාර ගුරුභවතුන්ගේ මග පෙන්වීමෙන් අමාත්‍යවරුන්, අමාත්‍යාංශ කමිටු හා වැඩසටහනේ සාමාජිකයන්ගේ ද සහභාගිත්වයෙන් ව්‍යාපෘතියක් ලෙස සකසා පාර්ලිමේන්තු මහ ලේකම්ට ඉදිරිපත් කර, අනුමත කර ගෙන ක්‍රියාත්මක කළ යුතු ය.

19.10 පාසලේ විෂයමාලාව හා සම්බන්ධ කර ගනිමින් වඩා ඵලදායී හා ඉගෙනුම් කාර්යයක් ලෙස පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුව විනයානුකූල ව පවත්වා ගෙන යාම මහ ලේකම් හා නියෝජ්‍ය මහ ලේකම්වරුන්ගේ වගකීම වේ.

19.11 පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුව විනයානුකූල ව පවත්වා ගෙන යාමට නියෝජිතයන්ට විශේෂ පුහුණු හා අත්දැකීම් ලබා දෙමින් සංවර්ධනාත්මක ප්‍රවේශ ඇති කළ යුතු ය.

19.12. මෙම ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන පාසලේ හා සිසුන්ගේ සමස්ත සංවර්ධනයට ප්‍රතිජනනාත්මක ව යොදා ගැනීමට උත්සුක විය යුතු ය.

19.13 කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයන් පත් කර ගැනීමේ දී ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිතයන්ගෙන් නාම යෝජනා කැඳවා ඡන්දයක් පවත්වා වැඩි ඡන්ද ලබා ගන්නා ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනා තෝරා පත් කර යැවීමට කටයුතු කළ යුතු ය. මිශ්‍ර පාසලක නම් වැඩි ම ඡන්ද ලබා ගත් ශිෂ්‍යයා හා ශිෂ්‍යාව තෝරා එවීමට කටයුතු කළ යුතු ය.

## 20 <u>ශිෂ්‍ය පාර්ලිමේන්තුවල විවාදයට බඳුන් වන ප්‍රශ්න</u>

20.1 පොදු වැදගත්කමකින් යුතු කිසියම් කරුණක් සම්බන්ධයෙන් ඕනෑම මන්ත්‍රීවරයකුට යෝජනාවක් ඉදිරිපත් කිරීමේ බලය තිබේ. එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමට පෙර ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට ඉදිරි පත් කර ඔහුගේ නිර්දේශය ලබා ගත යුතු ය.

20.2 නිර්දේශ ලබා ගැනීමෙන් පසු ඉදිරිපත් කරන එම යෝජනාව විවාදයට ලක් කළ යුතු අතර, ශිෂ්‍ය නියෝජිතයන් ඉදිරිපත් කරන යෝජනා සංවර්ධනය කරමින් විවාදයට එක් වන ශිෂ්‍ය නියෝජිතයන් අදහස් ඉදිරිපත් කළ යුතු වේ. එක් ශිෂ්‍ය නියෝජිතයකු විසින් ඉදිරිපත් කරන අදහසක් සංවර්ධනය කරමින් විවාදයට භාජනය වන කාර්යයන් පිළිබඳ පාසල් සිසුන් වශයෙන් ඔවුන්ට එක් ව ඉටු කළ හැකි වගකීම් පිළිබඳ ව වැඩි අවධානය යොමු කළ යුතු ය.

විවාදයට ලක්වන ඕනෑ ම යෝජනාවක් සංශෝධන සහිත ව සම්මත කර ගැනීමේ වගකීම පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවට පැවරෙන අතර, එම සම්මත කර ගත් යෝජනා අතර පාසල් සිසුන් වශයෙන් එක් ව කටයුතු කළ හැකි කාර්යයන් වේ නම් ඒවා ඉටු කිරීම සඳහා අදාළ අංශය වෙත ඉදිරිපත් කිරිම ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සතු වගකීමකි.

20.4. පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ දී ක්‍රියාවට නැංවීම සඳහා යෝජනා කර සම්මත වන වැඩසටහන්

ක්‍රියාවට නැංවීමේ දී ඒ ඒ ශිෂ්‍ය පාර්ලිමේන්තුවල සම්මත වන වැඩ සටහන් අනුව ඒ ඒ ශිෂ්‍ය පාර්ලිමේන්තු මහ ලේකම්වරුන් පහත සඳහන් ක්‍රියා පිළිවෙත් අනුගමනය කළ යුතු ය.

20.5 (අ). පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේදී සිසුන්ට එක් ව ක්‍රියාවට නැගිය හැකි යෝජනාවක් සම්මත වූයේ නම් එම යෝජනාව ක්‍රියාවට නැඟීම සඳහා ශිෂ්‍ය අමාත්‍යාංශයට සමගාමී ව ක්‍රියාවට නැගෙන අදාළ වැඩසටහනට පැවරිය යුතු ය. අදාළ වැඩසටහන විසින් එම සම්මත වූ යෝජනා ක්‍රියාවට නංවා එම ප්‍රගතිය විදුහල්පති මගින් පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තු මහලේකම්වරයාට ඉදිරි පත් කළ යුතු ය.
ආ) එම ප්‍රගති වාර්තාව ශිෂ්‍ය පාර්ලිමේන්තුවට ඉදිරි පත් කළ පසු පාර්ලිමේන්තුවේ සෙසු ශිෂ්‍ය නියෝජිතයන්ට එම කාර්ය පිළිබඳ සමාලෝචනය කරමින් විවාද කිරීමට අවස්ථාව සලසා දිය යුතු වේ.

## 21. 1 කථානායකවරයාගේ කාර්යභාරය

21.1.1 ශිෂ්‍ය පාර්ලිමේන්තුවල මූලාසනය දරනු ලබන්නේ කථානායකවරයා ය.

21.1.2 ශිෂ්‍ය පාර්ලිමේන්තුවල මහලේකම්වරයාගේ උපදෙස් මත පවත්වාගෙන යාම; ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ පනත් සම්මත කිරීම සඳහා ඡන්ද විමසිය යුතු අවස්ථාවක දී ඡන්ද විමසීම, ශිෂ්‍ය පාර්ලිමේන්තු කැඳවීම හා කල්තැබීම.

## 21.2. නියෝජ්‍ය කථානායකගේ කාර්ය භාරය

21.2.1 කථානායකවරයා නොමැතිවිට ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මූලාසනය හෙබවීම නියෝජ්‍ය කථානායකවරයා විසින් සිදු කරනු ලබන අතර 21.1.1 හි ඇතුළත් කථානායකවරයාගේ කාර්යභාරය එම මූලාසනය දරන අවස්ථාවේ ඉටුකළ යුතු ය.

## 21.3 නියෝජ්‍ය කාරක සභා සභාපතිගේ කාර්ය භාරය

21.3.1 කථානායකවරයා හා නියෝජ්‍ය කථානායක ශිෂ්‍ය පාර්ලිමේන්තුවල මූලාසනයේ නොමැති අවස්ථාවල නියෝජ්‍ය කාරක සභා සභාපති ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මූලාසනය හෙබවිය යුතු ය. එහි දී ඔහු කථානායකවරයාගේ කාර්යභාරයට යටත් වේ.

21.3.2 කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභාපතිවරයා සභාවේ නොමැති විටක ශිෂ්‍ය මන්ත්‍රීවරයකු ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මූලාසනය හොබවනු ලබයි.

## 21.4 අග්‍රාමාත්‍යවරයාගේ කාර්යභාරය

21.4.1 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ විනය පවත්වා ගෙන යාම අග්‍රාමාත්‍යවරයා සතු වේ.

21.4.2 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාව සම්පාදන මුදල් කටයුතු අග්‍රාමාත්‍යවරයාට පැවරේ. ව්‍යවස්ථා සම්පාදනය අවශ්‍ය වූ විට එම සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ වගකීම අග්‍රාමාත්‍යවරයාට පැවරේ.

21.4.3 ශිෂ්‍ය පාර්ලිමේන්තු කාණ්ඩායමේ මූලාසනය හොබවනු ලබන්නේ අග්‍රාමාත්‍යවරයා විසිනි.

21.4.4 ශිෂ්‍ය පාර්ලිමේන්තු අග්‍රාමාත්‍යවරයාට යහපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අමාත්‍ය ධුරය පිරිනැමෙන අතර එම අමාත්‍ය ධුරයට අදාළ පහත වගකීම් ඉටු කළ යුතු වේ. ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා පරමාධිපත්‍ය, නිතිය, නීතියේ ආධිපත්‍ය ආදි ප්‍රජාතන්ත්‍රවාදී මූලික ගුණාංග පිළිබඳව පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

එම කටයුතු කරගෙන යාම සඳහා මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් මැතිවරණ නිලධාරීන් හා සම්බන්ධීකරණය ගොඩනගා ගනිමින් ඉහත වැඩසටහන් සංවිධානය කිරීම.

## 21.5 සභානායකවරයාගේ කාර්යභාරය

21.5.1 ශිෂ්‍ය පාර්ලිමේන්තු රැස්වීම්වලට ශිෂ්‍යයන් සහභාගී කරවා ගැනීම විවේක අවස්ථාවලින් පසු නියමිත වේලාවට ශිෂ්‍ය පාර්ලිමේන්තුව රැස්කිරීමට කටයුතු කිරීම.

21.5.2 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කථික නාමලේඛනය සැකසීම සඳහා ශිෂ්‍ය පාර්ලිමේන්තු මහ ලේකම් වරයාට සහය වීම, ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ විනය පවත්වාගෙන යාමට අග්‍රාමාත්‍යවරයාට සහය වීම.

## 21.6 ශිෂ්‍ය පාර්ලිමේන්තු මහ ලේකම්ගේ රාජකාරි

21.6.1 පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තු මහ ලේකම් නියෝජ්‍ය මහ ලේකම්වරුන් වශයෙන් ද කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තු මහ ලේකම් හා නියෝජ්‍ය මහ ලේකම්වරුන්ගේ රාජකාරි වශයෙන් අවශ්‍ය වූ විටක සඳහන් කරන තුරු පොදුවේ පාසල් කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවල රාජකාරී විස්තර වන්නේ ය.

21.6.2 විදුහල්පතිවරයාගේ උපදෙස් මත පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තු හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ උපදෙස් මත කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තු රැස්වීම් කැඳවීම.

21.6.3 ශිෂ්‍ය පාර්ලිමේන්තුවල දී කථානායකවරයාගේ දිවුරුම් ගැනීම.

21.6.4 ශිෂ්‍ය පාර්ලිමේන්තු පවත්වාගෙන යාම සඳහා කථානායකවරයා නොමැති අවස්ථාවක දී මූලාසනය හොබවන නියෝජ්‍ය කථානායකවරයාට හෝ නියෝජ්‍ය කාරක සභා සභාපතිට හෝ ශිෂ්‍ය නියෝජිතයකුට හෝ පාර්ලිමේන්තු පවත්වා ගෙන යාම පිළිබඳ උපදෙස් දීම.

21.6.5 කථානායක, නියෝජ්‍ය කථානායක, කාරක සභා සභාපති, නියෝජ්‍ය කාරක සභා සභාපති, සභානායක, අගමැති ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමට සිදු වුවහොත් ඡන්දය විමසීමේ කටයුතු සිදු කිරීම.

21.6.6 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අමාත්‍යවරුන් තෝරා පත් කර ගැනීම සඳහා, ශිෂ්‍ය නියෝජිතයින්ගේ නාම යෝජනා ලබා ගැනීම හා අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් තෝරා පත් කිරීම, අමාත්‍යාංශ උපදේශන කාරක සභා සඳහා සාමාජිකයන් තෝරා ගැනීම.

21.6.7 ශිෂ්‍ය පාර්ලිමේන්තුව සාකච්ඡාවට හෝ විවාදයට හෝ ගනු ලබන යෝජනා ශිෂ්‍ය නියෝජිතයන්ගෙන් ලබා ගැනීම හා සුදුසු යෝජනා ශිෂ්‍ය පාර්ලිමේන්තුවලට ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම.

21.6.8 ශිෂ්‍ය පාර්ලිමේන්තු රැස්වීම්වල න්‍යාය පත්‍රය සකස් කිරීම, කථික නාම ලේඛනය සැකසීම.

21.6.9 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සම්මත වන යෝජනා පාසල් ශිෂ්‍ය අමාත්‍යාංශවලට සමගාමී ව ක්‍රියාත්මක වැඩසටහන් මගින් ක්‍රියාවට නැගීමට අවශ්‍ය විධිවිධාන යෙදීම.

21.6.10ශිෂ්‍ය පාර්ලිමේන්තුවල විනය පවත්වා ගෙන යාම, විනය විරෝධි කටයුතු සඳහා අවශ්‍ය පියවර ගැනීම.

21.6 .11ශිෂ්‍ය පාර්ලිමේන්තුවල පුරප්පාඩු වන ආසන සඳහා නියෝජිතයන් පත් කිරීමට කටයුතු කිරීම.

**21. 7 ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජ්‍ය මහ ලේකම් (පාලන) කාර්යභාරය**

21.7.1 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ රාජකාරිවලට සහය වීම

21.7.2 ශිෂ්‍ය පාර්ලිමේන්තුව කැඳවීම, ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කථික නාම ලේඛනය සැකසීම

21.7.3 අදාල අංශ සමග සම්බන්ධතා පැවැත්වීම සහ විනය පවත්වා ගැනීමට කටයුතු කිරීම

<u>21.8. **ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජ්‍ය මහ ලේකම් ( සංවර්ධන) කාර්යභාරය**</u>

21.8.1 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කටයුතු වලට සහය වීම

21.8.2 ශිෂ්‍ය නියෝජිතයන් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ විවාද කිරීම සඳහා ඉදිරිපත් කරන යෝජනා අතරින් සඳහා සුදුසු යෝජනා තෝරා ශිෂ්‍ය පාර්ලිමේන්තුට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම

21.8.3 ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සම්මත වන යෝජනා ක්‍රියාවට නැගීමට අවශ්‍ය පියවර ගැනීම

21.8.4 විවිධ රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය.

**22. කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුව**

22.1. අධ්‍යාපන කලාප මට්ටමින් කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තු පිහිටුවනු ලැබේ.

22.2. මෙම ශිෂ්‍ය පාර්ලිමේන්තුව අදාළ අධ්‍යාපන කලාපයේ නමින් හැඳින්වේ.

22.3 කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුව, අධ්‍යාපන කලාපයේ සියලු ම 1AB, 1C, 2 වර්ගයේ පාසල්වල පිහිටුවා ඇති ශිෂ්‍ය පාර්ලිමේන්තුවල ශිෂ්‍ය නියෝජිතයන්ගේ ජන්දයෙන් තෝරා ගන්නා ශිෂ්‍ය නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

22.4 කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිත සංයුතිය පහත පරිදි වේ.

(අ) කලාපයේ සියලු ම 1-AB" 1-C" 2 වර්ගය යන පාසල්වලින් එක් පාසලකින් නියෝජිතයින් දෙදෙනකු වශයෙන් තේරී පත් වේ. මිශ්‍ර පාසලකින් නම් ශිෂ්‍යයකු හා ශිෂ්‍යාවක වශයෙන් තෝරා ගත යුතු ය.

(ආ) පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිතයන්ගෙන් නාම යෝජනා කැඳවා ඡන්දයක් පවත්වා වැඩිම ඡන්ද ලබා ගන්නා ශිෂ්‍ය නියෝජිතයන් දෙදෙනා කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයන් දෙදෙනා ලෙස තෝරා පත් කර ගනු ලැබේ.

(ඇ කලාපයේ පාසල්වල ජනවර්ග සංයුතිය අනුව අවම ජනවර්ග සහිත පාසල් සඳහා පහත පරිදි ප්‍රසාද මන්ත්‍රී ධුර හිමි වේ. එම ප්‍රසාද මන්ත්‍රී ධුර හිමි වන පාසල්, ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පෙළ ගස්වා ශිෂ්‍ය ශිෂ්‍යාවන් වැඩි ම පාසලේ සිට මන්ත්‍රී ධුර ලබා දීමට කටයුතු කළ යුතු ය.

(ඇ) ප්‍රසාද මන්ත්‍රී ධුර හිමි වන්නේ පහත වගුව 4 පරිදි ය. ඒ අයුරින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ගණනය කර දැනුම් දිය යුතු ය.

| | අධ්‍යාපන කලාපයේ ඒ ඒ ජනවර්ගයට අයත් පාසල් සංඛ්‍යාව අනුව ප්‍රසාද ආසන පිරිනැමීම සඳහා සලකා බලන ප්‍රතිශත | ප්‍රතිශතයට අනුව පිරිනමන ප්‍රසාද ආසන සංඛ්‍යාව |
|---|---|---|
| 01 | 50% ට අඩු 45% ට වැඩි | 01 |
| 02 | 45% ට අඩු 40] ට වැඩි | 02 |
| 03 | 40% ට අඩු 35% ට වැඩි | 03 |
| 04 | 35% ට අඩු 30% ට වැඩි | 04 |
| 05 | 30% ට අඩු 25% ට වැඩි | 05 |
| 06 | 25% ට අඩු 20% ට වැඩි | 06 |
| 07 | 20% ට අඩු 15% ට වැඩි | 07 |
| 08 | 15% ට අඩු 10% ට වැඩි | 08 |
| 09 | 10% ට අඩු 5% ට වැඩි | 09 |
| 10 | 5% ට අඩු | 10 |

වගුව 4

22.5 කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවට නියෝජිතයන්, පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයෙන් තෝරා විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය.

22.6. කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම්, නියෝජ්‍ය මහ ලේකම් (සංවර්ධන) නියෝජ්‍ය මහ ලේකම් (පාලන) නියෝජ්‍ය මහ ලේකම් (විනය) යන ප්‍රධාන තනතුරු හතරකි.

22.7. කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරය නිල බලයෙන් ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත හිමි වේ.

22.8 කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් (සංවර්ධන) ලෙස සමාජ විද්‍යා විෂය අධ්‍යක්ෂවරයා ද, නියෝජ්‍ය මහ ලේකම් (පාලන) ලෙස සමාජ ඒකාග්‍රතා හා සාම අධ්‍යාපන කලාප සම්බන්ධීකරණ නිලධාරියා ද, නියෝජ්‍ය මහ ලේකම් (විනය) ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරන සුදුසු නිලධාරියකු ද පත් කළ යුතු ය.

22.9 කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුව සඳහා අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් තෝරා පත් කර ගැනීමේ දී,

(අ) ශිෂ්‍ය නියෝජිතයින්ගේ කැමැත්ත හා අත්දැකීම් අනුව අමාත්‍යාංශවලට කණ්ඩායම් කිරීම.

(ආ) ඔවුනොවුන් හඳුනා ගැනීමට, එකිනෙකාගේ දක්ෂතා හඳුනා ගැනීමට හා අත්දැකීම් හුවමාරු කර ගැනීමට මනෝ සමාජයීය ක්‍රියාකාරකම් ඇතුළත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

(ඇ) අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය තනතුරු සඳහා පත් කිරීමට සුදුසු සිසුන් දෙදෙනකු බැගින් යෝජනා කර සම්මත කර ගැනීමට කණ්ඩායමට අවස්ථාව ලබා දීම.

**කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ශිෂ්‍ය නිලතල හා අමාත්‍යාංශ, පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ආකෘතිය අනුව ම වේ.**

22.10 මංගල සැසිවාරය ආරම්භ වීමට පෙර කථානායක හැර ප්‍රධාන නිල දරන සිවු දෙනා, අමාත්‍යාංශ මට්ටමෙන් තෝරා ගත් අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහලේකම් ඉදිරියේ දිවුරුම් දිය යුතු වේ.

22.11 ඉන් අනතුරුව මංගල සැසිවාරය පැවැත්විය යුතු ය. එම සැසිවාරයේ පළමුවෙන් ම කථානායක තනතුර සම්මත කර ගෙන පාර්ලිමේන්තුවේ මහලේකම් ඉදිරියේ දිවුරුම් දිය යුතු වේ.

22.12 අනතුරු ව සියලු ම මන්ත්‍රීවරුන් කථානායක ඉදිරියේ දී දිවුරුම් දීම සිදුකළ යුතු ය.

22.13 කථානායක විසින් කලාප පාර්ලිමේන්තුව පවත්වාගෙන යමින් ඉදිරි කටයුතු සැලසුම් කළ යුතු ය.කරනු ලැබිය යුතු ය.

22.14 නැවත සභාව රැස්වන දිනය සම්මත කර ගෙන සභාව කල් තැබීමට කටයුතු කළ යුතු ය.

22.15 කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කාර්යභාරය

(අ) කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳ විධිමත් වාර්තා නියෝජ්‍ය මහ ලේකම් (පාලන) විසින් අඛණ්ඩ ව පවත්වා ගෙන යා යුතු ය.

(ආ) සම්මත වන යෝජනා මහ ලේකම් විසින් පාසල්වලට අදාළ පරිදි යොමු කළ යුතු ය.

(ඇ) එම යෝජනා ක්‍රියාවට නැංවීම පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අදාළ අමාත්‍යාංශ මගින් සිදු කළ යුතු ය.

ඉහත 22.10 සිට 22.15 දක්වා කාර්යයන් එක් දින වැඩමුළුවක් ලෙස හෝ දෙ දින වැඩමුළුවක් ලෙස හෝ සුදුසු පරිදි සැලසුම් කළ හැකි ය.

## 23 පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුව

23.1 පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුව පළාත් මට්ටමින් පිහිටුවනු ලැබේ.

23.2 එය පළාතට අයත් කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවල පහත තනතුරු දරන නියෝජිතයන්ගෙන් සමන්විත විය යුතු ය.

- කථානායක
- අග්‍රාමාත්‍ය
- සභා නායක
- නියෝජ්‍ය කථානායක
- නියෝජ්‍ය කාරක සභා සභාපති
- අමාත්‍යවරුන් 10

23.3 පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ව්‍යුහය ද පාසල්/ කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවල ව්‍යුහයට සමාන වේ.

23.4 පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරය නිල බලයෙන් ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට හිමි වේ.

23.5 නියෝජ්‍ය මහ ලේකම් (සංවර්ධන) තනතුර සමාජ විද්‍යා විෂය සම්බන්ධීකරණ නිලධාරියාට ද නියෝජ්ය මහ ලේකම් (පාලන) තනතුර පළාතේ සමාජ ඒකාග්‍රතා හා සාම අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරිට ද නිලබලයෙන් හිමිවන අතර නියෝජ්‍ය මහ ලේකම් (විනය) තනතුර සඳහා සුදුසු නිලධාරියකු පත් කිරීමේ බලය පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට හිමි වේ.

23.6 පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සැසිවාර කැඳවීම

(අ) සෑම පාසල් වාරයකට ම එක් වරක්වත් පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සැසිවාරයක් අනිවාර්යයෙන් ම කැඳවිය යුතු ය.

(ආ) පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ උපදෙස් මත නියෝජ්‍ය මහ ලේකම් (පාලන) විසින් සැසිවාර කැඳවිය යුතු ය.

23.7 පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සැසිවාර පැවත්වීම නිලධාරින් තෝරා ගැනීම කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ක්‍රමවේදයට ම සිදු කළ යුතු වේ.

23.8 **පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කාර්යභාරය.**

මෙය පළාත තුළ ශිෂ්‍ය නියෝජිතයින්ගේ අත්දැකීම් හුවමාරු කෙරෙන වැඩසටහනකි. මෙ මගින් පළාතක් ලෙස අවධානය යොමු කළ යුතු කාලීන අවශ්‍යතා හඳුනා ගැනීමට මෙන් ම ජාතික තලයේ

වැඩසටහන් සඳහා පළාතේ වගකීම සාකච්ඡා කිරීමට හා සම්මුතිවලට එළඹීමට අවස්ථාව සැලසේ. ඒ අනුව පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සම්මත වන යෝජනා කලාප මහලේකම් මගින් පාසල්වලට යොමු කෙරෙනු ඇත. ඒවා ක්‍රියාවට නැංවීමට පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවට අවස්ථාව සැලසේ. එසේ ම පළාත විසින් හඳුනා ගනු ලැබූ සුවිශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ද පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවට අවස්ථාව ඇත.

## 24. ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව

24.1 ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව සමන්විත වන්නේ දිවයිනේ සියලු ම අධ්‍යාපන කලාපවල පිහිටුවා ඇති කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවල නියෝජිතයන් ගෙනි.

24.2 එක් කලාපයකින් ශිෂ්‍ය නියෝජිතයකු දෙදෙනෙකු වශයෙන් කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ යෝජනා ස්ථිරත්වයෙන් තෝරා ගත යුතු ය.

24.3 ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු ව්‍යුහය පාසල්, කලාප, පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තු ව්‍යුහයන්ට සමාන වෙයි.

24.4 ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරය නිල බලයෙන් ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත හිමි වේ.

24.5 නියෝජ්‍ය මහ ලේකම් (සංවර්ධන) තනතුර අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) වෙත ද, නියෝජ්‍ය මහ ලේකම් (පාලන) තනතුර අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය සමගාමී, මාර්ග උපදේශන හා සාම අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද, නියෝජ්‍ය මහ ලේකම් (විනය) තනතුර අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද නිල බලයෙන් හිමි වේ.

24.6 ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සම්බන්ධීකරණ හා මෙහෙයවීම් කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ ශිෂ්‍ය පාර්ලිමේන්තු කටයුතු භාර නිලධාරිට හා ජාතික අධ්‍යාපන ආයතනයේ පුරවැසි අධ්‍යාපන විෂය භාර නිලධාරිට පැවරෙයි.

24.7 ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ තනතුරු හා තනතුරු සඳහා තෝරා ගැනීම කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ක්‍රමවේදයට අනුකූල ව සිදු කළ යුතු ය.

24.8 ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව සෑම වසරකට ම එක් වරක් හෝ පැවැත් විය යුතු අතර එය එක් දිනක වැඩමුළුවක් හා දෙ දින සභා වාරයක් ලෙස පැවත්විය යුතු ය.

24.9 මෙම දින දෙක තුළ ඒ ඒ අමාත්‍යාංශයට අයත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ ව ශිෂ්‍ය නියෝජිතයන්ට විවාද කිරීමට හා අදහස් පළ කිරීමට අවස්ථාව සැලසෙනු ඇත.

(අ). ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩමුළුවේ දී පළාත් මට්ටමින් එක් එක් පළාතේ ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව නියෝජනය කරන නියෝජිතයන් රැස් වී එක් එක් විෂය සම්බන්ධ ව තම පළාතේ ගැටලු හා ප්‍රවණතා සම්බන්ධයෙන් සාකච්ඡා කර සමස්තයක් වශයෙන් ඒ ඒ විෂයයන් පිළිබඳ කථා කළ හැකි ශිෂ්‍ය නියෝජිතයන් තෝරා ගත යුතු ය.

(ආ). මෙසේ පළාත් මට්ටමින් රැස් වී සාකච්ඡා කිරීමේ දී එක් එක් විෂයය පිළිබඳ අදහස් දක්වන ශිෂ්‍ය නියෝජිතයන්ගේ නමින් ම සහ තමන් කථා කරනු ලබන කරුණුවල

සාරාංශයක් ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් (පාලන) වෙත ලිඛිත ව ලබා දිය යුතු වේ.

(ඇ). එක් එක් විෂය ක්ෂේත්‍රය යටතේ අදහස් පළ කිරීම සඳහා පළාත් අධ්‍යාපන බල ප්‍රදේශවල ශිෂ්‍ය නියෝජිතයන් දස දෙනකුට අවස්ථාව හිමි වෙයි.

(ඈ) එක් එක් විෂය ක්ෂේත්‍රය යටතේ තම ප්‍රදේශයට බලපාන ගැටලු හා සංවර්ධන යෝජනා පිළිබඳ අදහස් පළ කිරීමට ශිෂ්‍ය නියෝජිතයකුට මිනිත්තු 5 ක කාලයක් ලබා දෙනු ඇත.

(ඉ) පළාත් නියෝජිතයන්ගේ අදහස් සමාලෝචනය කරමින් සමස්ත විෂය පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට විෂය භාර අමාත්‍යාවරයාට මිනිත්තු 10 ක කාලයක් හිමි වෙයි.

24.10 ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කාර්යභාරය.

මෙය ජාතික තලයේ ශිෂ්‍ය නියෝජිතයින්ගේ අත්දැකීම් හුවමාරු වැඩසටහනකි. මෙමගින් ජාතික මට්ටමේ දී අවධානය යොමු කළ යුතු වැඩසටහන් සාකච්ඡා කිරීමට හා සම්මුතිවලට එළඹීමට අවස්ථාව සැලසේ. ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුවට අනන්‍ය වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද අවස්ථාව ඇත. ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සම්මත වන යෝජනා පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවට යොමු කර ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවලට යොමු කළ යුතුය.

**උප ලේඛනය 1**

**ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශ දහයකි.**

1. ශිෂ්‍ය චර්යා සංවර්ධනය හා ශිෂ්‍ය සුබ සාධන අමාත්‍යාංශය.
2. ශිෂ්‍ය නිපුණතා හා නව නිපැයුම් කටයුතු අමාත්‍යාංශය.
3. අන්තර් පාසල් සුහදතා ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය.
4.. අධ්‍යාපන මානව සම්පත් සංවර්ධන හා තොරතුරු සන්නිවේදන අමාත්‍යාංශය.
5. සංස්කෘතික, ආගමික කටයුතු හා සාරධර්ම ප්‍රවර්ධන අමාත්‍යාංශය.
6. සමාජ සංහිඳියාව හා ශිෂ්‍ය ආරක්ෂක කටයුතු අමාත්‍යාංශය.
7. ප්‍රජා සබඳතා සංවර්ධන හා ප්‍රජා සේවා අමාත්‍යාංශය.
8. සෞඛ්‍ය, පෝෂණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය.
9. කෘෂිකර්ම හා පරිසර සංවර්ධන අමාත්‍යාංශය.
10.. භෞතික සම්පත් සංවර්ධන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය.

## 1. ශිෂ්‍ය චර්යා සංවර්ධනය හා ශිෂ්‍ය සුබ සාධන අමාත්‍යාංශය

- ශිෂ්‍ය ස්වයං විනයක් ගොඩ නැගීම.
- පොදු ආචාර ධර්ම පද්ධතියක් බල ගැන්වීම හා ක්‍රියාත්මක කිරීම.
- ශිෂ්‍ය ආපනශාලා අධ්‍යාපන අමාත්‍යාංශය චක්‍රලේඛයට අනුව පවත්වා ගෙන යාම සඳහා ක්‍රියා කිරීම.
- ශිෂ්‍ය උපදේශනය හා මානසික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ළමා සංවර්ධනය ඉලක්ක කර දෙමාපියන් දැනුවත් කිරීම.
- විවිධ ආබාධ ඇති හා විශේෂ අවශ්‍යතා ඇති සිසුන් ගැන අදාළ අංශවල සම්බන්ධීකරණයෙන් වැඩ පිළිවෙළක් දියත් කිරීම.
- සමාජයේ විපතට පත් ජනයාගේ අවශ්‍යතා හඳුනා ගැනීම හා ඒ සඳහා සහාය වැඩසටහන් යෝජනා කිරීම හා ක්‍රියාවට නැංවීම.
- උපකාර අවශ්‍ය පාසල් සිසුන් හඳුනා ගැනීම, ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කිරීම හා ඔවුන් සඳහා උපකාර වැඩසටහන් සංවිධානය.
- පාසල් සිසුන්ගේ සුබසාධන කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම, විවිධ වැඩසටහන් යෝජනා කිරීම හා ක්‍රියාවට නැංවීම.
- පාසල් උපකරණ සහන මිලට සපයා ගැනීම සඳහා උපාය මාර්ග හඳුනා ගැනීම හා ක්‍රියාවට නැංවීම.
- ගුරු සිසු ප්‍රවාහනය සලසන රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණය.

- පාසල් සිසුන්ගේ සුබසාධන කටයුතු පිළිබඳ අදහස් යෝජනා ලබා ගනිමින් ඵලදායි අදහස් ක්‍රියාවට නැංවීම.
- පාසල් සිසුන්ගේ චර්යා සංවර්ධනයට බාධා වන අභ්‍යන්තර, බාහිර ක්‍රියාකාරකම් හඳුනා ගැනීම හා ඒවා වළක්වා ගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පාසලේ, නිවසේ හා මහ මග ශිෂ්‍ය විනය පිළිබඳ ස්වයං ඇගයීමේ වැඩසටහන් ක්‍රියාවට නැගීම.
- දුම්වැටි, මත්ද්‍රව්‍ය හා මත්වතුර පිටුදැකීමේ වැඩසටහන් පාසලේ අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම.
- පාසල තුළට පිවිසෙන අසභ්‍ය පොත්පත්, විද්‍යුත් මෘදුකාංග භාවිතය සඳහා ඇති ඉඩ ප්‍රස්තා හා ප්‍රවේශ මාර්ග වැළැක්වීමට කටයුතු කිරීම.
- ශිෂ්‍ය පෞරුෂ වර්ධන ක්‍රියාකරකම් දියත් කිරීම.(ප්‍රාථමික ළමා සංවර්ධන වැඩසටහන් වැනි)

**2. ශිෂ්‍ය නිපුණතා හා නව නිපැයුම් කටයුතු අමාත්‍යංශය.**

- ශිෂ්‍යයන් පාසලට ඇතුල්වීම හා පිටවීම ක්‍රමවත් කිරීම
- ගුරු සිසු අන්තර් සබඳතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ශිෂ්‍යයන් වැඩ ලෝකයට හුරු කිරීම සඳහා අවශ්‍ය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- එදිනෙදා කාර්යයන් ඉටුකර ගැනීමේ දී විවිධ ආයතන සමග කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිපුණතා සංවර්ධනය, සිසුන්ගේ හැකියා, දක්ෂතා, ලැදියාවලට ගැළපෙන පරිදි නව නිපැයුම් සඳහා අවස්ථා සම්පාදනය කිරීම.

**3. අන්තර් පාසල් සුහදතා ගොඩනැගීමේ හා සංවර්ධනය කිරීමේ අමාත්‍යංශය.**

- අන්තර් පාසල් දැනුම හා අත්දැකීම් හුවමාරු වැඩසටහන් දියත් කිරීම.
- අන්තර් පාසල් ක්‍රීඩා කටයුතු දිරි ගැන්වීම.
- අන්තර් පාසල් සහභාගිත්වයෙන් ප්‍රජා සේවා හා අධ්‍යාපනික සේවා ක්‍රියාත්මක කිරීම.
- ප්‍රදේශයේ සිසුන්ගේ හා ප්‍රජාවගේ සංස්කෘතික, ආර්ථික, සමාජයීය ගැටලු පිළිබඳ සංවාදයට ලක් කිරීම, විසඳුම් යෝජනා කිරීම හා ක්‍රියාවට නැංවීම.
- සමාජ ඒකාග්‍රතාව හා ජාතිය ගොඩ නැගීම සඳහා කටයුතු කරන විවිධ රාජ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම හා ඔවුන් සමග වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- අධ්‍යාපන කලාපයේ හා පළාතේ සමස්ත පාසල් සමග පුළුල් සමාජ ඒකාග්‍රතාවක් ගොඩ නැගීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සැකසීම.
- සමාජ ඒකාග්‍රතාව හා ජාතිය ගොඩ නැගීම පිළිබඳ පාසල් ප්‍රජාවගෙන් සිදු විය යුතු මෙහෙවර පිළිබඳ පුළුල් කතිකාවතක් නිර්මාණය කිරීම.

**4. අධ්‍යාපන, මානව සම්පත් සංවර්ධන හා තොරතුරු සන්නිවේදන අමාත්‍යාංශය.**

- පාසල් සිසුන්ගේ අධ්‍යාපනික ගැටලු, අවශ්‍යතා හඳුනා ගැනීම, විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීම.
- අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම, සංවාදයට ලක් කිරීම හා ගුණාත්මක ඉගෙනුම් පරිසරයක් පාසලෙහි නිර්මාණය කිරීම.
- ස්වයං ඉගෙනුම් අවස්ථා හඳුනා ගනිමින් ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- පාසලේ මාධ්‍ය වැඩසටහන් නිර්මාණාත්මක ව ක්‍රියාවට නැංවීම.
- තොරතුරු සන්නිවේදනය සඳහා පාසලෙහි ක්‍රියාත්මක වැඩසටහන් විධිමත් කිරීමට අවශ්‍ය සහාය දීම .
- පාසල තුළ වෘත්තිය අධ්‍යාපන අවස්ථා සංවර්ධනය කිරීම හා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.
- අනාගත අභියෝග ජය ගැනීම සඳහා රැකියා වෙළෙඳ පොළ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ මාධ්‍ය භාවිතය හා මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ වැඩසටහන් ක්‍රියාවට නැගීම.
- දේශීය හා විදේශීය, ආර්ථික, සමාජයීය, දේශපාලන හා සංස්කෘතික නව ප්‍රවණතා පිළිබඳ සංවාද හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
- ශිෂ්‍ය මනසට නොගැලපෙන විවිධ මාධ්‍ය වැඩසටහන් පිළිබඳ පුළුල් කතිකාවතක් නිර්මාණය කිරීම හා වැඩසටහන් ප්‍රජාතන්ත්‍රවාදී ව ප්‍රතික්ෂේප කිරීම හා විරෝධය පළ කිරීම.
- විවිධ මාධ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩ නඟා ගැනීම.
- නායකත්ව, පෞරුෂ වර්ධන විශේෂ ශිෂ්‍ය වැඩසහන් හා ව්‍යාපෘති දියත් කිරීම.

## 5. සංස්කෘතික, ආගමික කටයුතු හා සාරධර්ම ප්‍රවර්ධන අමාත්‍යාංශය.

- පාසල ආරම්භයේ දී හා අවසානයේ දී ආගමික කටයුතුවලට මුල්තැන දී ක්‍රමවත් ව පවත්වා ගෙන යාම.
- පාසලට අනන්‍ය වූ ආගමික වැඩසටහන් සේ ම අන්තර් ආගමික වැඩසටහන් සංවිධානය.
- පාසල් සංස්කෘතිය ආරක්ෂා කර ගනිමින් සාරධර්ම ගොඩ නැගීමේ ක්‍රමවේද සකස් කර ක්‍රියාවට නැංවීම.
- පාසල් ශිෂ්‍ය විනය සංවර්ධනය සඳහා ආචාර ධර්ම පද්ධතියක් ගොඩ නැංවීම.
- අභාවයට යමින් පවතින පාරම්පරික සංස්කෘතික අංග හැඳින ගැනීම හා ආරක්ෂා කිරීමට වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ජාතික උරුම හඳුනා ගැනීමේ වැඩසටහන් හා විනාශයට පත්වන ජාතික උරුම පිළිබඳ පුළුල් කතිකාවතක් ගොඩ නැංවීම.
- රසවින්දනය ප්‍රගුණ කරන සෞන්දර්යාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සාරධර්ම ප්‍රවර්ධනයට සුදුසු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- වාර්ගික ව හා ප්‍රාදේශීය ව වෙනස් වන සිරිත් විරිත් හඳුනා ගැනීමේ වැඩසටහන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම.
- විවිධත්වයේ සුන්දරත්වය අත්විඳීම සඳහා අන්තර් සංස්කෘතික වැඩසටහන් සංවිධානය.

- සංස්කෘතීන්හි සමානාත්මතාව, සංස්කෘතික විකාශනය පිළිබඳ දේශන සම්මන්ත්‍රණ වැඩමුළු සංවිධානය.
- ශ්‍රී ලාංකේය ජන කලා, ජනශ්‍රැති හඳුන්වා දීම.
- ශ්‍රී ලාංකේය පාරම්පරික කලා උරුම හඳුන්වා දීම හා ඇගයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 6. සමාජ සංහිඳියාව හා ශිෂ්‍ය ආරක්ෂක කටයුතු අමාත්‍යාංශය.

- ගැටුම් නිරාකරණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම.
- පාසලේ හා පාසලෙන් බැහැර ශිෂ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ සංවිධානාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශිෂ්‍ය ආරක්ෂාව පිළිබඳ පුළුල් ලෙස කටයුතු කරන ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම.
- ගැටලු සහගත පවුල්, ප්‍රදේශ හඳුනා ගෙන සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
- දෙමාපියන් අහිමි වූ දරුවන් වෙනුවෙන් රැකවරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ළමා අපචාර, ළමා අපහරණය හා ළමා අපයෝජනය වළක්වා ගැනීමට කටයුතු කිරීම.

## 7. ප්‍රජා සබඳතා සංවර්ධන හා ප්‍රජා සේවා අමාත්‍යාංශය.

- පාසල් සිසුන්ට ඉටු කළ හැකි ප්‍රජා සේවා හඳුනා ගැනීම හා ප්‍රජා සේවා වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- පාසල හා ප්‍රජාව ඒකාබද්ධ ව වැඩසටහන් සංවිධානය කිරීම හා විවිධ ප්‍රජා වැඩසටහන්වලට සිසුන් සහභාගි කරවීම.
- විවිධ රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන සමග අන්තර් සබඳතා ගොඩ නැගීමේ උපාය මාර්ගික වැඩ පිළිවෙළක් සැකසීම.
- ප්‍රදේශයේ ජනතාවගේ පොදු අවශ්‍යතා පිළිබඳ පුළුල් සංවාදයක් ගොඩ නගමින් විවිධ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- පාසල් ආදි ශිෂ්‍ය සංගම්, ප්‍රජා සංවිධාන සමග පුළුල් අන්තර් සබඳතා ගොඩ නැගීම.
- පාසල් හැර ගිය සිසුන් සමඟ සම්බන්ධතා පවත්වා ගනිමින් ඔවුන්ගේ ගැටලු පිළිබඳ කතිකාවතක් ගොඩ නැඟීම.
- පාසල් සිසුන්ගේ හා ඔවුන්ගේ පවුල්වල පෞද්ගලික ගැටලු හඳුනා ගැනීම හා එම ගැටලු විසඳාලීමට සුදුසු වැඩපිළිවෙළක් සැකසීම.
- සියලු බාලදක්ෂ, ශිෂ්‍ය භට වැඩසටහන් විධිමත් ව පවත්වා ගෙන යාම.

## 8. සෞඛ්‍ය, පෝෂණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය.

- පාසලේ සෞඛ්‍ය හා සනීපාරක්‍ෂාව පිළිබඳ යහපුරුදු වැඩි දියුණු කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට ඍජු ව ම බලපාන ගැටලු පිළිබඳ විධිමත් හා හරවත් සංවාද සඳහා යොමු කිරීම.
- පාසල් සිසුන්ගේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීම.
- පෝෂණ වැඩසටහන් සඳහා ප්‍රජාවගේ සක්‍රිය දායකත්වය ලබා ගැනීම.
- පාසලේ ප්‍රථමාධාර කටයුතු ක්‍රියාත්මක කිරීම. (රතුකුරුස, ශාන්ත ජෝන්, සෞඛ්‍යදාන ආදිය)
- පාසල, සෞඛ්‍ය හා පෝෂණය සම්බන්ධ ආයතන හා ප්‍රජාව සමග පුළුල් අන්තර් සබඳතා ගොඩ නැංවීම හා සහාය ලබා ගැනීම.
- පාසල් සිසුන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය බිඳ වැටීමට හේතු වන බාහිර හා අභ්‍යන්තර කටයුතු පිළිබඳ අවධානය යොමු කර සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.
- බෝ වන හා බෝ නොවන රෝග පැතිරයාම වළක්වා ගැනීම සඳහා පුළුල් සංවාදයක් හා වැඩපිළිවෙළක් දියත් කිරීම.
- සමබල පෝෂණයක් සඳහා දේශීය ආහාර පරිභෝජනය දිරිමත් කිරීම.
- ක්‍රීඩා වැඩසටහන් ක්‍රමවත් ව සංවිධානය කිරීම සඳහා පියවර ගැනීම.
- ක්‍රීඩා සංවර්ධනය කිරීම පිළිබඳ ව පුළුල් සංවාදයක් ගොඩ නැගීම.
- පාරම්පරික ක්‍රීඩා, පාසල් පද්ධතියට හඳුන්වා දීම හා අභාවයට යමින් පවතින ක්‍රීඩා නගා සිටුවීම
- පාසල් ක්‍රීඩා අවස්ථාවල දී සාරධර්ම හා පාසල් විනය බිඳ වැටීම වැළැක්වීම පිළිබඳ ව කතිකාවතක් හා වැඩපිළිවෙලක් සකස් කිරීම.

## 9. කෘෂිකර්ම හා පරිසර සංවර්ධන අමාත්‍යාංශය.

- පාසල් පරිසර පවිත්‍රතාව පවත්වා ගෙන යාම.
- පාසල් පරිසර අලංකරණය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය පිළිබඳ කතිකාවතක් ගොඩනැඟිම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීම
- පරිසර සංවේදීතාව වර්ධනය කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ප්‍රාදේශීය පරිසර විනාශ පිළිබඳ තොරතුරු රැස් කිරීම හා පරිසර විනාශය අවම කිරීමට පියවර ගැනීම.
- විවිධ පාරිසරික කටයුතු හා සම්බන්ධ රාජ්‍ය ආයතන හා ස්වේච්ඡා සංවිධාන සමග සබඳතා ගොඩ නගා ගැනීම.
- ජාතික කෘෂිකර්ම හා පාරිසරික ප්‍රතිපත්ති පාසලේ ක්‍රියාවට නැගීම.
- දේශීය නිෂ්පාදිත පාරිභෝජනය දිරිගැන්වීම හා යොමු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පාසල් ගොවිපොළ, ගෙවතු වගා, ඖෂධ උයන්, වන උයන් නිර්මාණයට යොමු වීම.
- ප්‍රදේශයේ ගොවි ගැටලු පිළිබඳ අවධානය යොමු කිරීම හා පිළියම් සෙවීම.
- සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රම හඳුනා ගැනීම හා ඒවා ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- සාම්ප්‍රදායික කෘෂිකාර්මික උපකරණ සංරක්ෂණය කරන වැඩසටහන් සිදු කිරීම.
- පාසලේ පරිසර නියමු හට ශිෂ්‍ය ක්‍රියාකාරකම් දිරි ගැන්වීම.

## 10. භෞතික සම්පත් සංවර්ධන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය.

- පාසලේ භෞතික සම්පත් ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම.
- පාසලේ භෞතික සම්පත් සංවර්ධනය සඳහා ශිෂ්‍යයින් අතර සංවාදයක් ගොඩ නැගිම.
- පාසලේ භෞතික සම්පත් සුරක්ෂිත කිරීම සඳහා පාසල් සිසු, ගුරු හා දෙමාපිය සංවිධාන ගොඩ නැගීම.
- එස් 5 ක්‍රමය පාසල තුළ ක්‍රියාවට නැගීම.
- පාසල් වත්ත, ශාලා ගොඩනැගිලි, පාසලේ විවිධ කටයුතු සිදුවන ස්ථාන සංකේත මගින් බාහිරින් පැමිණෙන පුද්ගලයන්ට හඳුනා ගත හැකි වන පරිදි සලකුණු කිරීම.
- පාසල් පරිසරය ක්‍රමානුකූල ව සැකසීම හා නාමකරණය
- පාසලේ අවම සම්පත් මගින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම පිළිබඳ අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම .
- ප්‍රදේශයේ ප්‍රයෝජනයට ගත හැකි සම්පත් හඳුනා ගැනීම හා ඵලදායී ව යොදා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- හදිසි විපත් අවස්ථාවල දී උපකාර කිරීමේ ස්වේච්ඡා කණ්ඩායමක් ගොඩ නැගීම.
- ආපදා කළමනාකරණ අවස්ථාවන්ට මුහුණු දීමේ පරිසරයක් පාසල තුළ ගොඩ නැගීම.
- පාසල් ආපදා ආරක්ෂණ සැලස්ම සකස් කිරීම, දැනුවත් කිරීම, පුහුණු කිරීම හා ක්‍රියාවට නැංවීම

| |
|---|
| ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සියලු ක්‍රියාකාරකම් මගින් අවසාන වශයෙන් තිරසර සාමයක් හා තිරසර සංවර්ධනයක් ඇති කර ගැනීමට අවශ්‍ය නිපුණතා සිසු දරු දැරියන් තුළ සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු ය. |

## උපලේඛනය 2

**<u>පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිතයකු වශයෙන් තේරී පත්වීම සඳහා අපේක්ෂකයා ඉදිරිපත් කරන නාම යෝජනා පත්‍රය.</u>**

1. අපේක්ෂකයාගේ පෞද්ගලික තොරතුරු

    i. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම
    ii. අපේක්ෂකයාගේ නම මුලකුරු සමග

iii. පෞද්ගලික ලිපිනය
iv. උපන් දිනය
v. 20..... /..... /......දිනට වයස අවු........ මාස........ දින..........

2. ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයකු වශයෙන් නාම යෝජනා ලබා දෙන අපේක්ෂකයා දැනට දරන තනතුර

i. ප්‍රධාන ශිෂ්‍ය නායක
ii. උපප්‍රධාන ශිෂ්‍ය නායක
iii. ශිෂ්‍ය නායක
iv. ක්‍රීඩා නායක
v. පන්ති නායක
vi. වෙනත්

3. විෂය සමගාමී කටයුතු
පාසලේ ශිෂ්‍ය සමිති සමාගම්වල දැනට දරන තනතුරු

| විෂයානුබද්ධ/ විෂය සමගාමී | දරන තනතුර/ සාමාජිකත්වය | වර්ෂය |
|---|---|---|
| i....................................... | ....................................... | ................ |
| ii........................................ | ........................................ | ................. |
| iii........................................ | .......................................... | .................. |

4. විෂය බාහිර කටයුතුවලින් ලබා ගත් සම්මාන කුසලතා පිළිබඳ තොරතුරු

| අංශය | කුසලතා /ස්ථානය | වර්ෂය |
|---|---|---|
| i....................................... | ....................................... | ................ |
| ii........................................ | ........................................ | ................. |
| iii....................................... | .......................................... | .................. |

5. පාසලේ දී ක්‍රියාවට නගා ඇති වෙනත් ව්‍යාපෘති වැඩසටහන් සඳහා ලබා දී ඇති දායකත්වය

..........................................................................................................................................

..........................................................................................................................................

6. පාසලෙන් බැහැර සමාජයේ විවිධ සංවිධානවල දරන තනතුරු

| සංවිධානය | තනතුර |
|---|---|
| | |
| | |

7.පාසලේ හා සමාජයේ ක්‍රීඩා කටයුතුවල දී ලබා ගත් ජයග්‍රහණ

| පාසල්/අන්තර් පාසල් | පාසලෙන් බැහැර |
|---|---|
| | |

| | |
|---|---|
| | |

ඉහත තොරතුරු සත්‍ය බවත් නිවැරැදි බවත් සහතික කරමි. මෙම තොරතුරු අසත්‍යයැයි සනාථ වුවහොත් මම.................................... ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයකු වශයෙන් තේරී පත්වීමට හෝ එම තනතුර දැරීමට නුසුදුසු බව පිළිගනිමි.

අපේක්ෂකයාගේ නම .......................................................

දිනය.........................                                  අපේක්ෂකයාගේ අත්සන ..................................................

**පන්තියභාර ගුරුභවතාගේ නිර්දේශය**

..................................................... විද්‍යාලයේ .......................ශ්‍රේණියේ ඉගෙනුම ලබන ......................

............................................................... ශිෂ්‍ය අපේක්ෂකයා සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරැදි බව සහතික කරමි.

.......................................                                   ..........................................

පන්තියභාර ගුරුභවතාගේ නම                                   පන්තියභාර ගුරුභවතාගේ අත්සන

අංශ ප්‍රධාන /ශ්‍රේණි ප්‍රධාන ගුරුභවතාගේ නිර්දේශය

නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

ගුරුභවතාගේ නම අංශ ප්‍රධාන/ශ්‍රේණි ප්‍රධාන                    ගුරුභවතාගේ අත්සන අංශ ප්‍රධාන /ශ්‍රේණි ප්‍රධාන

**විදුහල්පති අනුමතිය**

ඉහත ශිෂ්‍ය අපේක්ෂකයා මෙම තනතුර සඳහා තෝරා ගැනීම අනුමත කරමි./නොකරමි.

.

.....................................                                   .....................................

විදුහල්පතිගේ නම                                   විදුහල්පතිගේ අත්සන

නිල මුද්‍රාව

**<u>පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අමාත්‍යවරයකු / නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් තේරී පත්වීම සඳහා ශිෂ්‍ය නියෝජිතයා ඉදිරිපත් කරන අයදුම් පත්‍රය.</u>**

1. අපේක්ෂකයාගේ පෞද්ගලික තොරතුරු

   i. සම්පූර්ණ නම
   ii. මුලකුරු සමග නම
   iii. පෞද්ගලික ලිපිනය
   iv. උපන් දිනය
   v. 20..... /..... /......දිනට වයස අවු........ මාස........ දින..........

2. ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයකු වශයෙන් පාසලේ දැනට දරන තනතුර

   i.ප්‍රධාන ශිෂ්‍ය නායක                    iv. ක්‍රීඩා නායක
   ii.උප ප්‍රධාන ශිෂ්‍ය නායක                v. පන්ති නායක

iiiශිෂ්‍ය නායක vi.වෙනත්

3. විෂය සමගාමී කටයුතු
පාසලේ ශිෂ්‍ය සමිති සමාගම්වල දැනට දරන තනතුර

| විෂයානුබද්ධ/ විෂය සමගාමී | දරන තනතුර/ සාමාජිකත්වය | වර්ෂය |
|---|---|---|
| i....................................... | ....................................... | ................ |
| ii........................................ | ........................................ | ................. |
| iii........................................ | ......................................... | .................. |

4. විෂය බාහිර කටයුතුවලින් ලබා ගත් සම්මාන, කුසලතා පිළිබඳ තොරතුරු

| අංශය | කුසලතා/ස්ථානය | වර්ෂය |
|---|---|---|
| i....................................... | ....................................... | ................ |
| ii........................................ | ........................................ | ................. |
| iii........................................ | ......................................... | .................. |

5. පාසලේ දී ක්‍රියාවට නගා ඇති වෙනත් ව්‍යාපෘති , වැඩසටහන් සඳහා ලබා දී ඇති දායකත්වය

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

6.පාසලෙන් බැහැර සමාජයේ විවිධ සංවිධානවල දරන තනතුරු

| සංවිධානය | තනතුර |
|---|---|
| | |
| | |
| | |
| | |

7.පාසලේ හා සමාජයේ ක්‍රීඩා කටයුතුවල දී ලබා ගත් ජයග්‍රහණ

| පාසල්/අන්තර් පාසල් | පාසලෙන් බැහැර |
|---|---|
| | |
| | |
| | |

| | |
|---|---|
| | |

ඉහත තොරතුරු සත්‍ය බවත් නිවැරැදි බවත් සහතික කරමි. මෙම තොරතුරු අසත්‍යයැයි සනාථවුව හොත් මම.................................... ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අමාත්‍යවරයකු / නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් තේරී පත්වීමට හෝ තනතුර දැරීමට නුසුදුසු බව පිළිගනිමි.

අපේක්ෂකයාගේ නම .......................................................

දිනය.........................          අපේක්ෂකයාගේ අත්සන .................................................

අංශ ප්‍රධාන /ශ්‍රේණි ප්‍රධාන ගුරුභවතාගේ නිර්දේශය
ඉහත ශිෂ්‍ය අපේක්ෂකයා මෙම තනතුර සඳහා තෝරා ගැනීම සුදුසු බව නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

----------------------------------------------------          ----------------------------------------------------
ගුරුභවතාගේ නම ( අංශ ප්‍රධාන /ශ්‍රේණි ප්‍රධාන)          ගුරුභවතාගේ අත්සන

**විදුහල්පති අනුමතිය**

ඉහත ශිෂ්‍ය අපේක්ෂකයා මෙම තනතුර සඳහා තෝරා ගැනීම අනුමත කරමි./නොකරමි.

........................................          ......................................
විදුහල්පතිගේ නම          විදුහල්පතිගේ අත්සන

නිල මුද්‍රාව

පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ නියෝජිතයකු වශයෙන් තේරී පත්වීම සඳහා අපේක්ෂකයා ඉදිරිපත් කරන නාම යෝජනා පත්‍රය හා පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අමාත්‍යවරයකු / නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් තේරී පත්වීම සඳහා ශිෂ්‍ය නියෝජිතයා ඉදිරිපත් කරන අයදුම් පත්‍රය පාසලේ අවශ්‍යතා මත වෙනස්කර ගත හැකි ය. එසේ ම ශිෂ්‍ය අමාත්‍යවරුන් තෝරා ගැනීමේ අයදුම්පත් 2008/15 චක්‍රලේඛයේ අයදුම්පත ද අධ්‍යයනය කර වෙනස් කර ගැනීමට හැකියාව පවතී.

## උපලේඛන 03

ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ ප්‍රධාන නිලතලවලට හිමි කාර්යභාරය

**මහලේකම්**

- මෙම උපදෙස් සංග්‍රහයේ මීට ඉහත සඳහන් කර ඇති කාර්යභාරයට අමතරව පහත සඳහන් කාර්යයන් ද මහ ලේකම්වරයා වෙත පැවරේ.

- ශිෂ්‍ය පාර්ලිමේන්තුව පිහිටුවීම හා පවත්වා ගෙන යාම සම්බන්ධ සියලු ම කාර්යයන් (නියෝජ්‍ය මහලේකම්වරුන් පත් කිරීම, නාම යෝජනා කැඳවීම, ඡන්ද පැවැත්වීම, නියෝජිතයන් තෝරා ගැනීම, ප්‍රධාන තනතුරු සඳහා ශිෂ්‍ය නියෝජිතයන් පත් කිරීම, ශිෂ්‍ය පාර්ලිමේන්තුව සඳහා පුහුණු සැසි පැවැත්වීම ආදිය)
- ශිෂ්‍ය නියෝජිතයන් සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ විනය පවත්වා ගෙන යාම.
- ශිෂ්‍ය පාර්ලිමේන්තුවලින් ඉදිරිපත් වන යෝජනා ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.

**නියෝජ්‍ය මහලේකම් (සංවර්ධන)**

- ශිෂ්‍ය පාර්ලිමේන්තු මහලේකම්ගේ කාර්යයට සහාය වීම.
- ශිෂ්‍ය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන යෝජනා විධිමත් ව සකස් කර ඉදිරිපත් කිරීම. සම්මත වන යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම හා සම්බන්ධීකරණ කටයුතු.

**නියෝජ්‍ය මහලේකම් (පාලන)**

- ශිෂ්‍ය පාර්ලිමේන්තු මහලේකම්ගේ කාර්යයට සහාය වීම.
- ශිෂ්‍ය පාර්ලිමේන්තු කාර්යයන් සඳහා සභා නායකට උපදෙස් දීම.

**නියෝජ්‍ය මහලේකම් (විනය)**

- ශිෂ්‍ය පාර්ලිමේන්තු මහලේකම්ගේ කාර්යයට සහාය වීම.
- ශිෂ්‍ය පාර්ලිමේන්තු විනය කටයුතු සක්‍රිය ව පවත්වා ගැනීමට දායක වීම.

**කථානායක**

- ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මූලාසනය හෙබවීම
- මහලේකම්වරයාගේ උපදෙස් මත ශිෂ්‍ය පාර්ලිමේන්තුව පවත්වා ගෙන යාම.
- පනත් සම්මත කර ගැනීම සඳහා ඡන්ද විමසීම.

**අග්‍රාමාත්‍ය**

- ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශ සම්බන්ධීකරණය
- ශිෂ්‍ය අමාත්‍ය මණ්ඩල රැස්වීම් කැඳවීම හා මුලසුන දැරීම.
- ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මුල්‍ය කටයුතු පවත්වා ගෙන යාම හා වර්ගීකරණය

**සභා නායක**

- සභාවේ සන පූරණය පවත්වා ගැනීම.
- රැස්වීම්වලට ශිෂ්‍ය නියෝජිතයන් සහභාගි කරවා ගැනීම.
- නියමිත වේලාවට ශිෂ්‍ය පාර්ලිමේන්තුව රැස් කරවීම.
- ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ කථික නාම ලේඛනය පවත්වා ගැනීම.

- ශිෂ්‍ය පාර්ලිමේන්තු පවත්වා ගෙන යාම සඳහා මහලේකම්වරයා හා නියෝජ්‍ය මහලේකම්වරුන්ට සහාය ලබා දීම.
- මහ ලේකම්ගේ උපදෙස් පරිදි සභාව කල් ගැනීමේ යෝජනා ඉදිරිපත් කිරීම.

**නියෝජ්‍ය කථානායක**

- කථානායකවරයා නොමැති විට ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මූලාසනය හෙබවීම

**නියෝජ්‍ය කාරක සභා සභාපති**

- කථානායක සහ නියෝජ්‍ය කථානායක දෙදෙනා ම නොමැති අවස්ථාවක දී ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මූලාසනය හෙබවීම.

**උපදේශක කාරක සභා**

- එක් එක් අමාත්‍යාංශයට අදාළ කාර්යයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම, නියාමනය හා අදාළ අමාත්‍යාංශය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- වැඩසටහන් නියාමක සම්බන්ධීකාරක ශිෂ්‍යයන් මගින් අදාළ වාර්තා හා මූල්‍ය කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාම.

## උපලේඛන 04

අමාත්‍යාංශ හා සම්බන්ධ වැඩසටහනෙහි සංයුතිය

1. වැඩසටහනට ඇතුළත් ගුරුභවතුන්
2. විෂය භාර ශිෂ්‍ය අමාත්‍යවරයා /ශිෂ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා
3. අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට ඇතුළත් ශිෂ්‍ය නියෝජිතයින්
4. වැඩසටහන් සම්බන්ධීකාරක නියෝජිතයින්
5. සෙසු ශිෂ්‍ය නියෝජිතයින් ( වගු අංක 2 ට අනුව)

**පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තු සමාරම්භක සභාවාරයේ**

**කියවිය යුතු අධ්‍යාපන ලේකම්ගේ ප්‍රකාශය**

පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට අවස්ථා සලසමින් නීතියේ ආධිපත්‍ය හා ඡන්දය ප්‍රකාශ කිරීමේ වැදගත්කම ද සංවාදය, සම්මුති, අන්‍ය මතයන්ට සවන්දීම හා ගරු කිරීම පිළිබඳ ව ආකල්ප කුසලතා සංවර්ධනයට අවස්ථා විවිර කර දෙමින්, අනාගත පුරවැසියන් වශයෙන් පාසල් සිසුන්ට ඔවුන් සමාජයේ අත් විඳින හා අත්දකින සාමාජයීය, ආර්ථික හා සංස්කෘතික ගැටලු පිළිබඳ විවෘත සංවාදයන්ට හා සාකච්ඡාවන්ට පිවිසෙමින්, ඔවුන්ගේ දැනුම පුළුල් කර ගනිමින්, තමන් අත් විඳින හෝ අත් දකින ගැටලු සඳහා විසඳුම් යෝජනා කරමින්, සංවාද තුළින් සම්මුතියට පැමිණ තම ශක්ති පමණින් තම දේශයට සේවය කළ හැකි අවස්ථා විස්තර කරමින් පුළුල් ජාතික අරමුණු ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලාංකේය පාසල් පද්ධතිය තුළ පිහිටවනු ලබන පාසල් ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන යටතේ ................................................................ විද්‍යාලයීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය වර්ෂ ..........................................මස ..................... දින ආරම්භ කළ බව දන්වා සිටිමි.